**<u>වර්ෂ 2025. 07.16 වන දින පෙ.ව. 09.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-</u>**

- <u>සභාපතිතුමා මුලසුන ගැනිම</u> :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාව පෙ.ව. 9.30 ට ආරම්භ කරන ලදී.
- පැමිණීම- මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමියන්ලා සහභාගී විය.

| අනු අංකය | තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|---|
| 1. | ගරු සභාපති | ජා.ජ.බ. | එම්. විකසිත පුෂ්පසූරිය මහතා | 08.34 |
| 2. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ඩී.කේ. පී. කුමාර ජයනෙත්ති මහතා | 08.36 |
| 3. | ගරු ප්‍රා.ස.ම. | ප්‍රජා.වාමාංශික | එච්.එම්. සිසිර සේනාරත්න මහතා | 08.40 |
| 4. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා | 08.40 |
| 5. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | එම්. ඩග්ලස් ප්‍රේමදාස මහතා | 08.50 |
| 6. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.පී. මහින්ද ජයලාල් පතිරණ මහතා | 08.52 |
| 7. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ඩී. චූලා ශාන්ති මිය | 08.52 |
| 8. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | බී.එල්. සුධීරා සේමිනි ලියනගේ | 08.52 |
| 9. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ටී. ඒ. රංගන විජේසුන්දර මහතා | 08.53 |
| 10. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ජී. සිරිල් කරුණාරත්න මහතා | 09.54 |
| 11. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්. කපිල අබේසිරි මුණසිංහ මහතා | 09.55 |
| 12. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්.ජී. එම්.නිරෝෂණ නාපාවල මහතා | 09.56 |
| 13. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ. ලීලානන්ද මහතා | 08.57 |
| 14. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ටී.එම්. උමේෂා මල්කාන්ති මිය | 09.00 |
| 15. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඩී.ජී. ජස්ටින් රණවීර මහතා | 09.02 |
| 16. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එච්.වී. මහින්ද මහතා | 09.03 |
| 17. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඒ. සෂිකලා මදුභාෂිනී මිය | 09.05 |
| 18. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -1 | අයි. මංගල කිත්සිරි ඩයස් මහතා | 09.06 |
| 19. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඩී. ආශා සමන්කුමාරි මිය | 09.06 |
| 20. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ජී. රංගනාත් ගහබඩගේ මහතා | 09.07 |
| 21. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්.ඒ. ඉනෝකා මල්ලව ආරච්චි මිය | 09.10 |
| 22. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතා | 09.11 |
| 23. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | අජිත් නන්දසිරි මනම්පේරි මහතා | 09.12 |
| 24. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.කේ. විජේසිරි මහතා | 09.12 |
| 25. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඒ. දමින්ද නලින් අදිකාරම් මහතා | 09.13 |
| 26. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ආර්.එල්. එන් මල්කාන්ති ලියනගේ | 09.14 |
| 27. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | කේ.එම්. ජයසේකර මහතා | 09.17 |
| 28. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | ජී.ඒ.ඊ. රනිල් එදිරිසිංහ මහතා | 09.18 |
| 29. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | සතා සිවම් චන්ද්‍රකුමාර් මහතා | 09.20 |
| 30. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.මහින්ද ගුණසිංහ මහතා | 09.21 |
| 31. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඒ. දේවින්ද කුමාර් මහතා | 09.22 |
| 32. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -1 | ඩී.එච්.හරිසිංහ මහතා | 09.23 |
| 33. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | ඒ. ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා | 09.23 |
| 34. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | ඩී.ඒ. මොහාන් චන්දික අමරසේන මහතා | 09.23 |
| 35. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.පී. රොෂාන් මධුසංක දේශප්‍රිය මහතා | 09.24 |
| 36. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයාවතී මිය | 09.35 |
| 37. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | බී.ඒ. එස්.පී. කැලුම් ශ්‍රී ධර්මදාස මහතා | 09.45 |
| 38. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | කේ.කේ. දුමින්ද කසුන් අමරසිංහ මහතා | 09.05 |
| 39. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඩබ්.ජයරත්න මහතා | 09.26 |
| 40. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | ඒ. නයනා ජීවනී අතුකෝරළ මිය | 09.26 |
| 41. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | අනිල් ජගත් කුමාර ලියනගේ මහතා | 09.28 |
| 42. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්. ප්‍රේමරත්න මහතා | 09.28 |
| 43. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | පී.වී. සුදර්ශන සම්පත් බොතේජු මහතා | 09.29 |
| 44. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා | 09.30 |
| 45. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එච්. තනූජා දීපානි චන්ද්‍රකා මිය | 09.35 |

01. පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සහා සම්මත කිරීම.
2023.03.07 දිනැති මහාසභා රැස්වීම් වාර්තාව.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා **:-**</u>

2023.03.07 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා:-</u>**

2023.03.07 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කිරීමේ යෝජනාව ස්ථිර කරමි.

**<u>සංශෝධන අංක 01</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී කේ.කේ.දයාවතී මිය.</u>**

**පසුගිය සභා වාර්තාවේ පිටු අංක 53 හි මුදල්කමිටු වාර්තාවට සහා අනුමැතිය දීමේ යෝජනාව මා විසින් ස්ථිර කල බවට සඳහන්ව ඇත. එය සංශෝධනනය විය යුතුයි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

එම වාර්තාවට අනුමැතිය දීමේ යෝජනාව ස්ථිර කිරීම මා විසින් සිදු කලා. සංශෝධනය කොට මාගේ නම යොදන්න.

**ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු 2023.03.07 වන දින මහා සභා වාර්තාව ඉහත සංශෝධනයට යටත්ව ඒකමතිකව මහා සභා සම්මත විය.**

**02.**සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන -

2026 වර්ෂය සඳහා අයවැය තොරතුරු ලබාගැනීම සිදු කරනවා.ප්‍රාදේශිය සභාව සතු මාර්ග,ළිං,තොටුපලවල්,පොදු වැසිකිළි,සායන හා ප්‍රාදේශීය සභාව සතු වෙනත් පොදු පහසුකම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීම සඳහා ගරු මන්ත්‍රිතුමන්ලාගේ යෝජනා 2025.08.15 දිනට පෙර සභාවේ ලේකම්වරයාට භාරදෙන ලෙස දන්වමි.

**03.සභා රැස්විමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා:-</u>

**1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී විජේසිංහ මිය 2025.07.16 දින, එනම් අද දින සැත්කමක් සඳහා රෝහල්ගතවන බැවින් මහාසභාවට සහභාගිවිමට නොහැකි බැවින් නිවාඩු ඉල්ලීම්කර ඇති අතර එම නිවාඩුව ලබාදීමට මහාසභා එකඟත්වය ලබාදීමට යෝජනාකරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

**එම යෝජනාව ස්තිර කරමි.**

**සභාමතය විමසීමෙන් අනතුරුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී විජේසිංහ මිය 2025.07.16 දින, එනම් අද දින සැත්කමක් සඳහා රෝහල්ගතවන බැවින් මහාසභාවට සහභාගිවිමට නොහැකි බැවින් නිවාඩු ඉල්ලීම්කර ඇති අතර එම නිවාඩුව ලබාදීමට මහාසභා එකඟත්වය ලබාදීමට ඒකමතිකව තීරණය විය.**

**04.**<u>ප්‍රාදේශීය සභාව අමතා එවනලද සංදේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරිම.</u>

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා:-</u>**

**1.වැටුම්මල,පරකඩුව පදිංචි කේ.ඩී.නිරෝෂණ දේශප්‍රිය මහතා පිළිකාරෝගයෙන් පෙලෙන අතර ඔහුගේ දරුවන් දෙදෙනාද හෘද රෝගීන් බවට අනාවරණය වී ඇත.සානුකම්පිතව සලකා බලා ඔවුන්ගේ ප්‍රතිකාර කටයුතු සඳහා කරුණාසහගත දීමනාවක් ලබාදෙනලෙස ඉල්ලා සිටී. ඉල්ලීම ඉදිරිපත් කරමි.**

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

මෙම ඉල්ලීම පිලිබඳව සියළු තොරතුරු සහිතව ඉදිරි සභාවාරයට යෝජනාවක් ලෙස ඉදිරිපත්කිරීමට කටයුතු කරමු.

**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -නැත.**

මෙම අවස්ථාවේදී **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා, රීති 33 සඳහන් ආකාරයෙන් දිනට නියමිත කටයුතු අනුපිලිවෙල වෙනස් කොට අද දිනයේ න්‍යායපත්‍රයේ අංක 09 යටතේ ඇති සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලිකිරීම් යන්න මෙම අවස්ථාවට ගෙන ඒමට වන යෝජනාවට අදාල ලිඛිත ඉල්ලීම ඉදිරිපත්කරන ලදී.ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ලා පිලිබඳව හඳුනාගැනීමක් , යම් විස්තරයක් කෙටියෙන් සභාවට ගෙන හැර දැක්වීම වැදගත් බවටත් ඒ සඳහා අංක 09 යටතේ වන සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලිකිරීම් මෙම අවස්ථාවෙදී සිදුකිරිමට සහා එකඟත්වය ඉල්ලා ඇත.සභාවේ එකඟත්වය සහිතව , අද දිනයේ න්‍යායපත්‍රයේ අංක 09 යටතේ ඇති සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලිකිරීම් යන්න මෙම අවස්ථාවේ යෝජනාව සිදුකිරීමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතාවිසින් අවසරය පතනලදි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-</u>**

**2025.07.16 දිනැති මෙම න්‍යායපත්‍රයේ අංක 09 යටතේ ඇති සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලිකිරීම් යන්න අනුපිලිවෙල වෙනස්කොට මෙම අවස්ථාවේදී එම සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලිකිරීම් යන්න සිදුකිරිමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-</u>**

නව සභාවේ මන්ත්‍රිවරුන් වරියන් 46 ක්. නමුත් මේ පිරිස බහුතරයක් අළුත් අය.මේක මංගල සභාව.රීති 33 අනුව අපි මේ අවස්ථාවේදි අපි හඳුනාගැනීමට මේ අවස්ථාව ගමු.එය වැදගත්.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා

පෞද්ගලික පැහැදිලිකිරීම් මුලට ගමු.46 ක් ඉන්න නිසා ඉතා කෙටියෙන් හඳුනාගැනීම් කරමු.කාලය ගැන සැලකිලිමත් වෙන්න.උපරිමය විනාඩි 5ක් ගන්න.

සභාමතය විමසීමෙන් පසු දිනට නියමිත න්‍යායපත්‍රයේ අංක 09 යටතේ සඳහන් **සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලිකිරීම් යන්න යටතේ ගරු මන්ත්‍රීවරුන් සම්බන්ධ ව හඳුන්වාදීමට, කරුණුදැක්වීමට අවස්ථාව ලබාදීමට මහාසභා ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මම වලඳුර කොට්ඨාශයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුන යටතේ තරඟ කරලා ජාතික ලයිස්තුවෙන් මෙම සභාවට පත්වුනා.මට පක්ෂව ඡන්දය දුන් සියළු දෙනාටම ස්තුතියි. සභාවේ මෙම අවස්ථාව අපිට සලසාදුන්න ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමන්ලාටත් ස්තුතියි.මෙම සභාව සියළු දෙනාට සාධාරනය ඉටුකරන සේවය සලසන ආයතනයක් බවට පත්කිරීමට මාගේ උපරිම ශක්තිය කැපවිම ලබාදෙමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඒ.මොහාන් චන්දික අමරසේන මහතා-**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මම මිල්ලවිටිය කොට්ඨාශයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුන යටතේ තරඟ කරලා ජන්ද වැඩිම ප්‍රතිශතය වාර්තා කරලා තේරි පත්වුනා.ජන්දය දුන් සැමට උත්තමාචාරය දක්වමි.වර්තමාන දේශපාලන තලය තුල ජනතාවට සාධාරන යුක්තිගරුක රටට ආදර්ශමත් සභාවක් ලෙස කටයුතු කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා-**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.දෙල්ගමු කොට්ඨාශය ශ්‍රී ලංකා පොදුජන පෙරමුන යටතේ තරඟ කරලා 2වන වතාවටත් මම තේරි පත්වුනා.ජන්දය ලබාදුන් සැමට ස්තුතියි.ඉදිරියේදි ජනතාවට සභාවට මාගෙන් ඉටුවියයුතු සියළු සේවාවන් සඳහා කැප වෙමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා-**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. කිතුල්පෙ කොට්ඨාශයෙන් තරඟ වැදී එක්සත් ජාතික පක්ෂ ජාතික ලැයිස්තුවෙන් සභාවට පත් උනා.ජන්ද තුන්දහස්ගනනනක වරම ලබාදුන් සියළු ජනතාවට ස්තුතියි.රනිල් වික්‍රමසිංහ ගරු පක්ෂ නායක තුමාට,මහලේකම්තුමාට ස්තුතියි.සභාවේ ජනතාවට ලබාදෙන සියළු සේවාවන්ට සහාය ලබාදෙමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.තනූජා දීපානි චන්ද්‍රිකා මිය-**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.දොඩම්පෙ කොට්ඨාශයෙන් තරඟ කරලා මා පත්වුන මංගල සභාව.සහාය දුන් සියළු දෙනාට ස්තුතියි.ගරු විජේතුංග මැතිතුමාටත් ස්තුතියි.කොට්ඨාශයේ යහපතට,සභා බල ප්‍රදේශයේ යහපත වෙනුවෙන් සේවය කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන් කුමාරි මිය-**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.සූදාගල කොට්ඨාශයෙන් සමගි ජන බලවේගය තරඟ කරලා ජාතික ලැයිස්තුවෙන් ආවේ.ගරු ගරු විජේතුංග මැතිතුමාටත් ස්තුතියි.මට සහාය දුන් සියළු ජනතාවට ස්තුතියි.උපරිම සහාය සියළු කටයුතු වලට ලබාදෙමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -**

தமிழ் மக்களின் அரசியல் குரலாக விளங்கும் தமிழ் முற்போக்கு கூட்டணி தலைவர் மணோகணேசன் அவர்களுக்கும், பல்வேறு அரசியல் நெருக்கடிகளுக்கு மத்தியில் குறிவிட்ட பிரதேச வாழ் தமிழ் மக்களின் நலன் கருதி என்னை தெரிவு செய்த தமிழ் முற்போக்கு கூட்டணியின் மாவட்ட பொறுப்பாளர் மற்றும் ஜனநாயக மக்கள் முன்னணியின் இணை உபத் தலைவர் அதிபர் சந்திரகுமார் அவர்களுக்கும் எங்களது கூட்டணி கட்சியான ஐக்கிய மக்கள் சக்தியினருக்கும், சரியான நேரத்தில் சரியான தீர்மானத்தை எடுத்த களுகாகம வட்டார வாழ் என் உறவுகளுக்கும் நன்றியை தெரிவித்துக் கொள்வதோடு மலையக தமிழனாய் அரசியல் ஆசான் சந்திரகுமார் கூறியது போல் உறவுகளுக்காக என் குரல் ஒலிக்கும் என்பதையும் பதிவு செய்து கொள்கிறேன்.

As one oF the up country tamil people,  I believe the requests I submit will be fulfilled. Because, most members of this Pradeshiya sabha, including the chairman and vicechairman have been elected as educated individuals.

උඩරට ද්‍රවිඩ ජනතාවගෙන් එක් අයෙකු වශයෙන් මම විශ්වාස කරනවා මගේ ඉල්ලීම් ( ජනතාව වෙනුවෙන් සිදු කරන) ඉටුවෙයි කියලා.හේතුව මේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා,උපසභාපතිතුමා ඇතුළු නියෝජිතයන් බහුතරයක් උගත් පිරිසගෙන් සමන්විත වීම නිසායි.

ගරු මන්ත්‍රීතුමා විසින් භාෂා ත්‍රිත්වයකින් සභාව ආමන්ත්‍රණය කල අතර තමාට සිංහල භාෂාවෙන් කටයුතු කලහැකි බවට දැනුම්දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.රංගනාත් ගඟබඩගේ මහතා -**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි .මාටුවාගල කොට්ඨාශයෙන් තරඟ කරලා වැඩි ජන්ද ප්‍රමාණයක් ලබාගෙන මම පත්උනා.සහායදුන් කොට්ඨාශයේ ජනතාවට ස්තුතියි. කොට්ඨාශයට බල ප්‍රෙද්ශයේ ජනතාවට උපරිම සේවය ලබාදීමට සහාය වෙමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවාරච්චි මිය -**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. පොදුජන එක්සත් පෙරමුණ තුලින් මට ජන්දය ලබාදී මාහට මෙම වරම ලබාදුන් කොට්ඨාශ තුනේ ම ජනතාවට ස්තුතියි.එසේම මෙම අවස්ථාව සලසාදුන් අනිල් ලියනගේ මහතාටත් ස්තුතියි.නිසි ලෙස ජනතාවට සහායලබාදී සභාකටයුතු තුලින් ජනතා අපේක්ෂා ඉටුකිරීමට සහාය වෙමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.දුමින්ද කසුන් අමරසිංහ මහතා -**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.තෙප්පනාව කොට්ඨාශයෙන් ස්වාධීන 1 කණ්ඩායමෙන් තරඟ වැදී සභාවට පත් උනා.ජන්දය ලබාදුන් සැමට ස්තුතියි.සහායලබාදුන් නයනා ජීවනී අතුකෝරළ මන්ත්‍රීතුමියටත් ටත් ස්තුතියි.සහයෝගයෙන් කුරුවිට ජනතාවට යහපත් පුරවරයක් බවට පත්කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සිසිර සේනාරත්න මහතා -**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි .ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුනෙන් ඉදිරිපත් වෙලා සභාවට පත්වුනා.මාගේ කණ්ඩායම් නායක වාසු දේව නානායක්කාර මැතිතුමාට වාසු පෙරමුනට මට ජන්දය දුන් සියළු දෙනාට ස්තුතියි.ජනතාව වෙනුවෙන් අවශ්‍ය සියළු සහාය ලබාදෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පද්මසිරි දෙල්ගොල්ල මහතා -**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් කාර්ය මණ්ඩලයෙන් අවසරයි.සමගි ජන බලවේගය මගින් කුරුවිට ප්‍රාදේශීය සභාව නියෝජනය කිරිමට අවකාශය ලබාදුන් ඇල්ලගාව කොට්ඨාශයේ ජනතාවට ස්තුතියි.කුරුවිට බස්නාහිර කෙළවරේ පිහිටි මේ කොට්ඨාශය කුරුවිට එක්ක සම්බන්ධ වෙන්නේ පරිපාලන කටයුතු වලදි විතරයි.මේ කොට්ඨාශයේ සංවර්ධන කටයුතු පිලිබඳවත් ඉදිරියේදි කටයුතු කරමු.ඉදිරි වසර 5 තුල සභාවේ සියළු සංවර්ධන කටයුතු වලදි සහාය ලබාදී ගෞරවය රැකගෙන කටයුතු කිරීමට අපිට හැකි වේවි.එතෙක් ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මුණසිංහපුර කොට්ඨාශයෙන් ජාතික ජනබලවේගය තුලින් මේ සභාවට මාව පත්කල ජනතාවට ස්තුතියි.ජනතා අභිලාශ ඉටුකිරිමට සහාය වෙමි. ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මම කිරිඇල්ල කොට්ඨාශය, ඉඩංගොඩ,හාන්දුකන්ද වසම් 3ට අදාල ප්‍රාදේශීය සභා නියෝජිතයා ලෙස පත්කල ,ඉහලින් ඔසවා තැබූ ඒ ආදර ජනතාවට ස්තුතියි.ඒ ජනතාව වෙනුවෙන් මගෙන් ඉටුවිය යුතු දේ මම නොපිරිහෙලා ඉටු කරනවා.මම වගකීම භාර ගන්නවා.අනෙක් සියළු ජනතා නියෝජිතයන්ටද නිවැරදි මග ගමන් කරන සැම විටකදිම සහාය වෙනවා.බේදයෙන් තොර ගමනක් යමු.ජනතාව වෙනුවෙන් අවශ්‍ය සියල්ල කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් කාර්ය මණ්ඩලයෙන් අවසරයි.කුරුවිට ප්‍රාදේශීය සභාවට සුවිශේෂී දවසක්.අපි ජනතාව වෙනුවෙන් වැඩ කරමු.ඒ වගකීම දරමු. තලාවිටිය කොට්ඨාශයෙන් තරඟ කරපු මාව විශ්වාස කරලා අංක 22 වෙනුවෙන් ජන්දය දුන් සැමට ස්තුතියි. කුරුවිට කිරිඇල්ල දෙකම සභාවට අයත් .මේ දෙකටම වැඩි බරක් තියලා ජනතාවට සමාන සේවයක් සලසමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවිර මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් කාර්ය මණ්ඩලයෙන් අවසරයි.කිතුල්පෙ කොට්ඨාශයෙන් ජාතික ජනබලවේගයෙන් තරඟ කරලා මට ජන්දය ලබාදුන් ජනතාවට ස්තුතියි.කොස්ගල කිතුල්පෙ හල්පෙ ජනතාවට

ස්තුතියි.නීත්‍යානුකූලව සාධාරණව සිදුකරන සියළු සංවර්ධන කටයුතු හා අනෙක් කටයුතු වලට සහාය වෙමි.සමගිව ජනතාව වෙනුවෙන් කටයුතු කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ලීලානන්ද මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් කාර්ය මණ්ඩලයෙන් අවසරයි.කොස්ගොඩ කොට්ඨාශය විශාලම කොට්ඨාශයක් තුලින් තෝරා පත්කරගත්තු මට ජන්දය දුන් නොදුන් සියළු දෙනාට ස්තුතියි.දිවා රෑ වෙහෙස නොබලා මේ ජයග්‍රහණ වෙනුවෙන් වෙහෙසුන සහෝදර සහෝදරියන්ට ස්තුතියි.ජනතා බදු මුදල් පළාත්සභා මුදල් ආණ්ඩුවේ මුදල් ආදි සියළු මුදල් ක්‍රමවේදයකට විනිවිදව වියදම් කරලා මේ සභාව ලංකාවේම ඉහලට ඔසවා තබමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආර්.එල්.නිරෝෂා මල්කාන්ති ලියනගේ මිය.</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මම වලදූර කොට්ඨාශයෙන් .මට මේ අවස්ථාව සලසා දුන්න ජාතික ජනබලවේගයටත් ආදරණීය ජනතාවටත් ස්තුතියි.මා කෙරේ තැබූ විශ්වාසය සමග මම ඉදිරියේදි සිදුකරන සියළු නිවැරදිකටයුතු සඳහා සහාය දෙනවා.අපි මේ සභාව සියළු දෙනා එක්ව ජනතාවට හොඳම ප්‍රාදේශීය සභාව බවට පත්කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.සශිකලා මදුභාෂිණී මිය.</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් කාර්ය මණ්ඩලයෙන් අවසරයි. මම ජාතික ජනබලවේගයෙන් පාතගම කොට්ඨාශයෙන්.සභාවට පත්වුනේ.ආර්ථික තත්වය අඩු,රැස්වීමක කතා කරන්න වත් ලැබිලා නැති අපි වැනි ජනතාවට නියෝජිතයෙක් ලෙස සභාවට ඒම ඉතා අපහසුයි.ඒත් ආදරණීය පක්ෂය නිසා මට මේ අවස්ථාව ලැබුනා.දිස්ත්‍රික් නායකතුමාට ස්තුතියි.අපේ ආදරණීය පක්ෂයේ අපි වෙනුවෙන් කාලයශ්‍රමය වැය කර අපේ ජය වෙනුවෙන් වෙහෙසුන සැමට හිස නමා ආචාර කරමි. පාතගම ජනතාවට ජන්දය දුන් නොදුන් සැමට ස්තුතියි.භේද නැතිව ජනතාව වෙනුවෙන් වැඩ කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.හරිසිංහ මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් කාර්ය මණ්ඩලයෙන් අවසරයි. මම මැදගම තෙප්පනාව ඉහලගම කොට්ඨාශ 3ක් නියෝජනය කරලා ජයගත්තා.ස්වාධීන.මම රජයේ රැකියාවක් කරනවා. මට ඒකත් පිටුවහලක් උනා.කුරුවිට සමුපකාර අධ්‍යක්ෂ මණ්ඩලයේ අවුරුදු 25 කට වැඩිය හිටියා. මම වැඩ කල අයෙක්.මට ජනතාව ගමේ ජනතාව ජන්දය දුන්නේ මම වැඩ කරන අයෙක් නිසා.අපි පක්ෂ බේදයකින් තොරව ,මාලිමාවේ නන්දලාල් මහා,තෙප්පනාව නියෝජනය කරන සහෝදර මන්ත්‍රිතුමන්ලා එකතු වෙලා ගමට වැඩ කරනවා.මට ජන්දය දුන් නොදුන් සැමට ස්තුතියි.තෙප්පනාව අපිට යම් ස්ථානයකට ගේන්න අවස්ථාව දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් කාර්ය මණ්ඩලයෙන් අවසරයි.අංක 15 මාටුවාගල කොට්ඨාශයෙන් ජාතික ජනබලවේගයෙන් සභාවට පත්වුනා.මාටුවාගල විද්‍යාලයේ විදුහල්පති ලෙස කටයුතු කලා අවුරුදු 29

ක්.උපසභාපතිතුමා,ජයරත්න මන්ත්‍රීතුමා,විජේසිරි මන්ත්‍රී තුමා මම සේවා කාලයතුල හදුනන අය.ගුරුගෝල සම්බන්න්ධයකුත් තියෙනවා.රංගනාත් මගේ ශිෂ්‍ය යෙක් ලෙස හිටියා. දැන් ජනතා නියෝජිතයෙක් වීම සතුටුයි.විජේසිරි මන්ත්‍රීතුමා සමග එජාපයේ එක පිලේ අවුරුදු 46 ක් කටයුතු කලා. පසුව මම වෙනස් උනා.ජාතික ජනබලවේගයෙන් ඉදිරිපත් වෙලා සභිකයෙක් ලෙස පත්උනා.සහයෝගයෙන් වැඩ කරලා මේ සභාව හොඳම ප්‍රාදේශීය සභාව බවට කිරුළ පළන්දමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය.</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් කාර්ය මණ්ඩලයෙන් අවසරයි.එල්ලාවල නියෝජනය කරලා ජාතික ජනබලවේගයෙන් මාව මෙතනට පත්කර එවූ සියළු ජනතාවට ස්තුතියි.ඉදිරියේදි සභාවේ සියළු කටයුතු වලට සහයෝගයෙන් කටයුතු කරමු. මේ සභාව ලංකාවේ හොඳම සභාව බවට පත්කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ටී.අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් කාර්ය මණ්ඩලයෙන් අවසරයි දෙහෙරගොඩ කොට්ඨාශයේ වැඩිම ජනමතයෙන් මාව මෙතැනට ගෙන ආ දෙහෙරගොඩ ජනතාවට ස්තුතියි.දෙහෙරගොඩ ග්‍රාම නිලධාරි ලෙස වසර 2 ක් සේවය කලා.දෙහෙරගොඩ කනුග්ගල්ල ජනතාවට ස්තුතියි.පක්ෂ බේදයකින් තොරව ජනතා අභිලාශ ඉටුකරමු.කුරුවිට ප්‍රාේද්ශීය සභාව ඉහලට ඔසවා තබන්න ශක්තිය දහිරිය සියළුදෙනාට ලැබේවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.දමින්ද නලින් අධිකාරම් මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ජාතික ජන බලවේගයෙන් මිල්ලවිටිය කොට්ඨාශයෙන් ප්‍රථම වතාවට මම සභාව නියෝජනය කරනවා.මිල්ලවිටිය ආදරණීය ජනතාවට ස්තුතියි.මට අවස්ථාව සලසා දුන් ජාතික ජනබලවේගය දිස්ත්‍රික් නායකතුමාට ස්තුතියි.අපි මේ සභාවට අවත්.පැරණි අයත් ඉන්නවා.ඒ අයගේ අත්දැකීම් තුළින් අපිවත් දැනුවත් කරන්න.ගම්වල වැඩ සාර්ථකව කරන්න සහාය වෙන්න.ගරු සභාපතිතුමාටත් සුභ පතමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.ගයාන් වික්‍රමසූරිය මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ජාතික ජනබලවේගය දෙල්ගමුව කොට්ඨාශයෙන් ආවේ.දෙල්ගමුව කුරුවිටට සුවිශේෂී වෙන්නේ සියළු රාජ්‍ය ආයතන සියල්ල තියෙන්නේ මේ ගමේ.මට වැඩිම ජන්ද ලබාදි මාව මේ ජනතා නියෝජිතයෙක් ලෙස පත්කල දෙල්ගමුව ජනතාවට ස්තුතියි.ප්‍රාදේශිය සභාවේ සියළු කටයුතු වලට මගේ උපරිම සහාය ලබාදීමට මම කටයුතු කරනවා. ගරු සභාපතිතුමාටත් සුභ පතමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කපිල අබේසිරි මුණසිංහ මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මම ජාතික ජනබලවේගය කුරුවිට කොට්ඨාශයෙන් පත්වුනා.

කුරුවිට,එක්නැලිගොඩ ජනතාවට ස්තුතියි.මට සහාය දුන් සියළු නිලධාරින් ජාතිකජනබලවේගය නායකත්වයට, ස්තුතියි.අපි ජනතාව වෙනුවෙන් කටයුතු කරමු.ප්‍රශණ බාධා එයි.ජනතා සේවය තුලින් යහපත් මානසික මට්ටමක් ජීවිතය සාර්ථක කරගන්න පුළුවන්.අපි සියළු දෙනා එකතු වෙලා අනාගත පරපුරට යහපත් රටක් හදමු.හිතවත් මේ සියළු දෙනා එක්ව රටට ආදර්ශමත් හොඳම සභාව බවට මේ සභාව පත්කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මම ජාතික ජනබලවේගය සූදාගල කොට්ඨාශය වැඩිම ජන්ද ප්‍රමාණය ලබාගෙන මෙම සභාවට පත්වුනේ.ශ්‍රී ලංකා නාවික හමුදාවේ වසර 22 ක් සේවය කලා.ඉන්පසු මට මේ සොඳුරු දේශපාලන පක්ෂය හමු උනා.ජනාධිපති,මහමැතිවරණ,පළාත්පාලන මැතිවරණ කටයුතු වලට සහාය දුන්නා.නාම යෝජනා දීමේදි පක්ෂය මාව තෝරාගත්තා.වැඩිම ජන්දප්‍රමාණයෙන් මම ජය ගත්තා.සූදාගල එරත්න සංචාරක කර්මාන්තයක් ලෙස සංවර්ධනය කල හැකි විභවයක්.සූදාගල පහසුකම් වැඩි කරලා දියුණුකරමු.එරත්න කැළුම් මන්ත්‍රිතුමාටත් සහාය දී සහයෝගයෙන් කටයුතු කරලා සූදාගල එරත්න ට සංවර්ධනයක් ලබාදීමට කටයුතු කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්.උමේෂා මල්කාන්ති මිය.</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.දෙවිපහල කොට්ඨාශයෙන් තරග කරලා ජාතික ජනබලවේගයෙන් සභාවට පත්උනා.දෙවිපහල,කීරගල,ආනන්දපුර ආදරණීය ජනතාවට ස්තුතියි.මම ආවේ අභිංසක ජනතාවගේ අභිලාශයන් ඉටුකරන්නයි.මා ලද අවස්ථාවෙන් උපරිමය කල යුතුයි.සාධාරනව මේ අභිලාශයන් ඉටුකරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.මහේෂ් නිරෝෂණ නාපාවල මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මාහට පත්බේරිය වසමෙන් ජන්ද 1163 ක් ලබාදී මාව ජයග්‍රහණයට පත්කල සහෝදර ජනතාවට , සියළු දෙනාට ස්තුතියි. මා පාසැල් අවධියෙන් පසු 1997 ශ්‍රී ලංකා යුධ හමුදා විශේෂ කාර්ය බලකායට බැදුනා.අවුරුදු 22 ක්එහි රාජකාරි කලා.ශ්‍රී ලංකා සමාජවාදි ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ යුද හමුදාවේ වීරත්වය වෙනුවෙන් පිරිනැමෙන විර පදක්කම් පහෙන් රණශූර පදක්කම දෙවරක් හා වීරවික්‍රම පදක්කම ද නොකැලැල් සේවය වෙනුවෙන් ලබාදෙන උත්තම සේවා පදක්කමද ඇතුළු පදක්කම් 14 ක් මාහට ලැබුණා.දෙස් විදෙස් පාඨමාලා 25 කට වැඩි සංඛ්‍යාවකට සහභාගීඋනා.එක්සත් ජාතින්ගේ සාම සාධක රාජකාරි යටතේ අවුරුදු 1 ට ආසන්න කාලයක් හයිටි දේශයේ රාජකාරි කලා. මා එක්ක එකට යුධ කල වීරෝදාර රනවිරුවන් 28708 ක් පමන මියගිහින්.60000ක් පමන තුවාල වෙලා.ඒ අය මේවන විටත් 10000 ක් පමන රණවිරු සෙවන රැකවරන ලබනවා.ඉතාමත් අපහසුවෙන් ගොඩනගාගත් මේරට අපි හදමු.පක්ෂ පාට අපිට එපා.අපේ අනාගත පරපුරට අපි රට හදමු.කිසිදු විටෙකත් වැරැද්දක් වෙනුවෙන් වැරදිකරන අය වෙනුවෙන් පෙනීහිටින්නෑ.ලබාගත් ජය තුලින් රට හදමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී බී.එල්.සුධීරා සේමිණී ලියනගේ මිය.**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.පුස්සැල්ල කොට්ඨාශයෙන් තරග කරලා මේ ජය ලබාදුන් පුස්සැල්ල ජනතාවට ස්තුතියි.ජාතික ජනබලවේගයේ අපේක්ෂකත්වය දුන්නාට ස්තුතියි.මා සමග ප්‍රෙද්ශයේ තවත් මන්ත්‍රිවරුන් දෙදෙනෙක් ඉන්නවා.සංවර්ධන කටයුතු එක්ව කරමු.අපිව විශ්වාස කල ජනතාවට සේවය කරමු.ලංකාවේ හොඳම ප්‍රාදේශීය සභාව බවට කුරුවිට පත්කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් පතිරණ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.බෝධිමළුව කොට්ඨාශයෙන් ජාතික ජනබලවේගය තුලින් මේ ජනතා නියෝජිත බව ලැබුවා.ජන්ද 1156 ක් ගෙන ජය ගත්තා.පරකඩුව,බෝධිමළුව ජනතාවට ස්තුතියි.මට ජීවිතයේ සබඳතා තිබුනේ මේ ප්‍රදේශ සමග නෙමේ.මම පදිංචිය ලඟත් නෙමෙයි.පක්ෂය දුන්න වගකීම ඉටුකලා.ජනතාව මාව විශ්වාස කලා.මට සහාය දුන්නා.වැඩිජන්ද ප්‍රමාණයක් ලබාදුන්නා.වත්මන් රජයේ මුඛ්‍ය පරමාර්ථය ලස්සන ශ්‍රී ලංකාවක්,පෙහොසත් රටක්.ජනතාවට ලස්සන ජීවිතයක් ගත කරන්න පසුබිම හදලා දෙන සභාවක් කරමු.ප්‍රමුඛ ශක්තිය යොදලා කැපවෙලා ලස්සන ජීවිතයක් ජනතාවට හදමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මම තලාවිටිය කොට්ඨාශයෙන් ජාතික ජනබලවේගයෙන් වැඩි ජන්ද ප්‍රමාණයකින් පත්වුනා.ජන්දය දුන්න ආදරණිය ජනතාවට හිතවතුන්ට සහාය දුන්නාට ස්තුතියි.ජාතික ජනබලවේතයේ මේ ජය අයිතිහාසික ජයක්.වෙනස් දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කලා මේ ජාතික ජනබලවේග ආණ්ඩුව.වසර 60 කපමන ඉතිහාසය තුල ජනතාව බලාසිටි ජයක්.කැපවූ සියළු දෙනාට ස්තුතියි.මම ගුරුවරයෙක්.විද විවාද නැතිව අනාගතයට පොහොසත් රටක්.ලස්සන ජීවිතයක් හදමු.තලාවිටිය සිංහල,මුස්ලිම් දෙමල සියළු ජනතාව ඉන්නවා.උපරිම සහයෝගයෙන් කටයුතු කරමු.ගරු සභාපතිතුමාටත් සුභපතනවා.සියළු කටයුතු සාර්ථක වීමිට ශක්තිය දිරිය සැමදෙනාටම පතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. රොෂාන් මධුශංක දේශප්‍රිය මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ගරු ශිරාන් මන්ත්‍රිතුමා ඇතුළු සියළු දෙනාගෙන් අවසරයි.අංක 3 පුස්සැල්ල කොට්ඨාශය පත්වූ මා දෙවන වරටයි මේ සභාව තුල සිටින්නේ.ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා, ඇහැලියගොඩ නිමල් විජේනායක මැතිතුමාටත් කෘතවේදි වෙනවා.මාහට මීට පෙර ප්‍රතිපාදන නොලැබුනත් දෙවන වරටත් මාව මෙතැනට පත්කර එවූ ඒ පුස්සැල්ල ජනතාවට ස්තුතියි.සිංහල දෙමල මුස්ලිම් ජනතාව සම්මිශ්‍රන ගමක්.තේ කැල්ල , රබර්කැල්ල,කලී වැඩ කරන මිනිස්සුයි මේ ජන්දය දුන්නේ.ඒ අහිංසක ජනතා අභිලාශ ඉෂ්ඨ කර ගන්න ප්‍රතිපාදන දෙන සභාවක් වෙයි මේ සභාව.ගරු සභාපතිතුමාට සුභ පතනවා.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඊ.ජ්.රනිල් එදිරිසිංහ මහතා-__

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.එරත්න කොට්ඨාශයෙන් එක්සත් ජාතික පක්ෂයෙන් තරඟකල මාහට ජනතාව ලබාදුන් සහායට ස්තුතියි.පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමාට,මහලේකම් තලතා අතුකෝරළ මැතිතුමියට ස්තුතියි.ජන්ද දායකයින්ට වැඩකරන පලදායි සභාවක් බවට කටයුතු කරමු.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඒ.නයනා ජීවනී අතුකෝරළ මිය.__

ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.කාන්තා නියෝජනයක් ලෙස දෙවන වරටත් මා මේ සභාවට පත්උනා.2015 රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සංකල්පයක් අනුව 25% කාන්තා නියෝජනය අනුව පළාත් පාලන මැතිවරන තුලින් මුල්වරට පාඨලී චම්පික මැතිතුමාගේ හෙළ උරුමය එකම කෝටාව ලෙස මම නියෝජනය වුනා. යහපාලන ආණ්ඩුවේ අවබෝධතා ගිවිසුම අනුව 2018මම සභාව නියෝජනය කලා.අවසානයේ වෙනත් පක්ෂ එකතු වෙලා අවස්ථාව නැතිඋන නිසා මම කාන්තාවක් ලෙස පැත්තකට වි සිටියේ නෑ.නමුත් මම පස්සෙන් ගියෙත් නෑ.ඇයි මට බැරි?මම ස්වාධීන කණ්ඩායමක් එක්ක මගේ ගමන ගියා.ජන්ද 3366 ක් ලැබිලා මම මේ සභාව අද නියෝජනය කරනවා.මේ පසුබිම හරිම දුෂ්කරයි.කාන්තාවක් නිසාම නින්දා අපහාස අසන්නට ලැබීම බොහෝවිට සිදුවිය හැකියි.කාන්තාවන් බය ඇයි?මොන ප්‍රශ්න තිබ්බත් කාන්තා නියෝජනය අවශ්‍යයි.අතරමග දමා යන්න එපා.කාන්තා නියෝජන අවැසි විටෙක දැන් 11 ක් ඉන්නවා.ඒ 11 අතරට එන්න මට, පාපන්දුව ලකුණට ජන්දය දුන් සැමට ස්තුතියි.ජනතාවගේ සුබ විහරණය වෙනුවෙන් කටයුතු කරමු.සියල්ලටම අවශ්‍ය පොදු උපයෝගිතා සේවා ලබාදෙමු.ගරු සභාපතිතුමා ඒ සඳහා අවශ්‍ය සියළු සහාය මා ගරු සභාවට ලබාදෙනවා. ස්තුතියි.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා-__

ගරු සභාපතිතුමා ,උපසභාපතිතුමා ,ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි 2018 වසරේ මන්ත්‍රීවරයෙකු ලෙස අපි සමග සිටි විකසිත ගරු සභාපතිතුමාට සුභ පතනවා.දෙවන වරටත් උපසභාපති අනිල් ලියනගේ මහතාටත් සුභ පතනවා. කුරුවිට සභාව කුරුවිට කිරිඇල්ල ලේකම් කොට්ඨාශ 2 ක් තියෙන මන්ත්‍රීවරු 46 ක් සිටින විශාලම බලප්‍රෙද්ශයක් තියෙන සභාවක්.2018 වසරේ සිට මේ ගමන්මගේ මා හට මේ ජය ලැබිමට සහායදුන් ජනතාවට ස්තුතියි.කිරිඇල්ලට අත්‍යවශය දේ කරමු.අඩුපාඩු බහුලයි.පොදු වැසිකිලිය ප්‍රතිසංස්කරණය කරන්න වෙලා. ලේකම්තුමා ටැප් හැදුවා.එයට ස්තුතියි. මේ ජනතා අවශයතා.වෙළඳ සංකීර්ණයේ ගැටළුව.හඬ නැගුවා.පත්තරවල ගියා.විතරයි.කනගාටුව පලකරනවා.අයවැයට සහාය දුන්නා. කිරිඇල්ල ප්‍රෙද්ශයේ ගැටළු වලට විසඳුම් ඉල්ලා බලපෑම් කලත් යම්කිසි අඩුපාඩු තිබුන නිසා උත්තර තිබුනේ නෑ.දේශපාලන බලපෑම් තිබුනා.මින් ඉදිරියටවත් බලපෑම් නැති ව මහජන අවශ්‍යතාවලට මුල්තැන දී කටයුතු කරමු.මේ සභාවේ හිඟ බදු, කුරුවිට පොලට,අවධානය දෙමු.පොදු දේ ගැන සොයාබලමු.ගරු සභාපතිතුමා, ඉල්ලිමක්කරනවා.අපි ඔබතුමාගේ වසර 5 මේ කාලයට උපරිම සහාය දෙනවා.ජනතා ගැටළු ගැන සාධාරනව බලන්න.ප්‍රතිපාදන බලප්‍රෙද්ශයටම සංවර්ධනයට දෙන්න.පණතේ ප්‍රකාරව ජනතාවට සේවය කරමු. මාව පත්කල ,ජන්දය දුන් සැමට ස්තුතියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි කේ.කේ.දයාවති මිය.-

ගරු සභාපතිතුමා ,උපසභාපතිතුමා ,ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.අංක 9 ශ්‍රී ලංකා පොදුජන පෙරමුනෙන් තරඟකරලා මම දෙවන වරටත් මේ සභාව නියෝජනය කරන්නේ.ගරු සභාපතිතුමත් මාත් එකම ගමේ.කුඩා කලසිට දන්නවා.වතුයායඋඩකඩ,කඳංගොඩ ජනපදය සියළු ජනතාවට ස්තූතියි.මා පසුගිය වර්ෂවල වගේම ඉල්ලා සිටිනවා වතුයායට යන මාර්ගය සංවර්ධනය කරන්න.ඒ පාර ලොකු කරලා නිසි ලෙස සකසන්න.නව සභාපතිතුමාට හදවතින්ම සුභ පතනවා.දෙවන වරටත් උප සභාපති උන අනිල් උපසභාපතිතුමාට ත් සුභ පතනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා .-

ගරු සභාපතිතුමා ,උපසභාපතිතුමා ,ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.

මෙවර පැවැත්වූ මැතිවරණයේ දි මියණදෙනිය කොට්ඨාශයේ සමගි ජනබලවේගය අපේක්ෂක ලෙස ඉදිරිපත්වූ මා ජනතාවගෙන් ඉලල්ලා සිටියේ එකට එක්ව පක්ෂ බේදයෙන් තොරව සහයෝගය දෙන ලෙසයි.ඒ අනුව ඡන්ද 1638 ක් ලබා 53.5% ක ප්‍රතිහතයක් ලබා මා ජය ගත්තා එලෙස වාර්තා ගත ජයක් පක්ෂ බේදයෙන් තොරව ලබාදෙන්නට කටයුතු කල කොට්ඨාශයේ විහාරාධිපතිස්වාමින් වහන්සේලා,වතු පූජක තුමන්ලා හා ආදරණීය ග්‍රාමීය හා වතු ජනතාවට මම ස්තූතිය පුද කරනවා.මෙම සභාවට විපක්ෂයෙන් මන්ත්‍රීවරුන් 26 ක් පත්විමත් සමග ජනබලවේගය ප්‍රමුඛ විපක්ෂයට බලය ගැනීමට ගරු ඒ.ඒ.විජේතුංග මැතිතුමා ගරු නීතිඥ නිමල් විජේනායක මැතිතුමා ගරු රංජිත් බණ්ඩාර මැතිතුමා හිටපු ගරු අමාත්‍ය ජානක වක්කුඹුර මැතිතුමා දිස්ත්‍රික් කලමණාකරු ගරු රෝහණ කෝනාර මැතිතුමා හා අප එක්ව කණ්ඩායම අවස්ථා කීපයකදි සාකච්චා පවත්වා ගත් උත්සාහයට එතුමන්ලාටද ස්තූතියි.ගරු විජේතුංගමැතිතුමාට හා ගරු රංජිත් බන්ඩාර මැතිතුමාට අවශයා තිබුනේ ගරු දේවින්ද මැතිතුමාට සභාපතිකමත් ගරු කැළුම් මන්ත්‍රිතුමාට උප සභාපතිකමත් ලබාදී විපක්ෂයට බලය ලබාගැනීමටයි.වැඩි ජන්ද ප්‍රතිශතය මා හට තිබුනත් ගත් පක්ෂ තීරනයට හිස නමා මා කටයුතු කලා.නමුත් තීරනාත්මක අවස්ථාවේ ඒ ජන්ද දේවින්ද මන්ත්‍රිතුමාට නොලැබුන නිසා ඒ අවස්ථාව අහිමි උනා.ඇතිවන්නට තිබූ තත්වය අවබෝධව තිබුනානම් මේ තත්වය වන්නේ නෑ.බහුතරය ගැනිමට අවශ්‍ය මන්ත්‍රීවරුන් මට සහාය දෙන බව දන්වා සිටියත් මට අවස්ථාව දුන්නේ නෑ.රත්නපුර හා කුරුවිට සභාවලට දෙබිඩි පිලිවෙතක් ගන්නට ගොස් බලය අහිමිවිම ගැන ජනතාව ඉන්නේ වේදනාවෙන්.මට අඩු ජන්ද ප්‍රමාණයක් තිබ් දේවින්ද මන්ත්‍රතුමාට වැඩිජන්ද තිබ් මා සභාපතිවන්නට ගොස් ඒ බලය මට අහිමිවුවානම් ඇතිවන තත්වය කෙබඳු වෙයිද?මා ඇතැම් දේශපාලන බලධාරීන් සමග ගැටුම් ඇතිකර ගත්තේ ජනතාව වෙනුවෙන්.මාගේ පැවැත්ම තියෙන්නේ ජනතාව වෙනුවෙන් කැපවෙන නිසයි.මාව දේශපාලනයෙන් කපන්නට උත්සහ කලත් ජනතාව මා ඔසවා තබනවා.

මේ සම්බන්ධව තව දුරටත් දීර්ග ලෙස අදහස්දැක්වූ අතර කොට්ඨාශයේ තරග කල දෙනුෂ බන්ඩාර මහතා,මහේෂිකා උමයන්ගනි මියට,සහාය දුන් ගරු නිමල් විජේනායක මැතිතුමාට ස්තූතිය පල කල අතර බලය ඇතත්නැ තත් සියළු කටයුතු වලදී සහාය වනබවත් ගරු මන්ත්‍රිතුමා විසින් දැනුම්දුනි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.සිසිර කැළුම් ධර්මදාස මහතා .-</u>

ගරු සභාපතිතුමා ,උපසභාපතිතුමා ,ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.එදා මහාසභාවේ 45 අතර සිටි විකසිත මන්ත්‍රීතුමා සභාපති වෙයිකියලා කීයටවත් හිතුවේ නෑ.ගත්ත උත්සහට කැපවීමට ස්තුතියි.අපි හැමෝටම උප සභාපති වෙන්න බෑ.අනිල් උප සභාපතිතුමාටත් සුභ පතනවා.මම 72% ප්‍රතිශතයක් අරන් සභාවට ආවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුනෙන්.එරත්නේ රනිල් මන්ත්‍රීතුමා හිටියා.එරත්න ලස්සකන්ද මට සහාය දුන් සියළු ජනතාවට ස්තුතියි.රටේ රජය ජාතික ජනබලවේගය වෙද්දි උනත් ජයගත්තා.ඒ විශ්වාසයට ස්තුතියි.මෙතන නවක මන්ත්‍රීවරු විශාල පිරිසක් ඉන්නවා.අපි සියළු දෙනාව එක්ව කටයුතු කරමු.විරසක වෙයි. නමුත් මොන විරුද්ධකම් තිබුනත් මේ සභාවෙන් එලියට යද්දි කරේ අතදාගෙන යන්නේ.හැමදේටම අත උස්සන්න බෑ.තෝරාගත් නිවැරදි දේට සහාය දෙමු.එරත්න ජනතාව මාව පත්කලේ වැඩ කරන්න.තව ඉන්නේ ඥාති වරයෙක්.වසර දෙකක් මම ජයගත්තා.රනිල් මන්ත්‍රී අඩවිකන්ද ජයගත්තා.ඒ ජනතාවිශ්වාසය පළුදු නොවී වැඩ කල නිසයි.අපි සහෝදර බැම්මෙන් හිටියේ. අපි කතා කරලා තින්දු තීරන අරන් වැඩ කරමු.ගරු සභාපතිතුමාට සහාය දෙනවා.සුබ දවසක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා .-</u>

ගරු සභාපතිතුමා ,උපසභාපතිතුමා ,ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මම වැඩිය කතාකරන්න හිටියේ නෑ.නමුත් මාව පෙළඹුනා.යම් සිද්ධියක් මා පැහැදිලි කලයුතුයි.මම ප්‍රථම වතාවට 2011 වසරේ මෙම සභාවේ සභාධුරයක් දරනවා.එතැන් පටන් මෙවරත් සමගි ජනබලවේගය ගලුකාගම ජනතාව මාව විශ්වාස කලා.සිංහල දෙමල ජනතාව.හැමදාම මාව විශ්වාස කලා.දුෂ්කර කාපලරිච්ජේද වල නාලන්ද භීෂනයකාලේ,පොහොට්ටුව ගෝඨාභය ජනපති ජයගත්කාලේ,මෙවර ජාතික ජනබලවේගය ජයගත් කාලේ.විශිෂ්ඨ ජයක් මට ගෙනදුන්නා.මගේ වගකීම මේ ජනතාවට සාධාරනව මගේ වගකීම් ඉටුකරන එක.ඒ නිසා මන්ත්‍රීවරු 10 ක් එක්ක 24 ක් හදන සටනට මම ආවේ. මගේ නමින් චෝදනා කලඒවා මම පිලිගන්නේ නෑ.මගේ පක්ෂනායක සජිත් ප්‍රේමදාස මැතිතුමා සහ ඒ.ඒ.විජේතුංග මැතිතුමා පවරපු වගකීම ඉටු කරන්නයි මම ඉදිරිපත්උනේ.මේ අවස්ථාවේ සංවිධනය වීමේදි මම විජේසිරි මන්ත්‍රීතුමාගේ ගෙදරටත් ගියා.නමුත් මේවැනි කතාවක් කිව්වේ නෑ.කිව්වා නම් ඒක සුහදව විසඳා ගන්නවා.මාහට සංග්‍රහ කරලා කතා කලා.හිතේ තිබුන දේ කිව්වේ නෑ.මම තරඟය පටන් ගත්තා. රත්නපුර සභාව දිනෙව්වා.කැප වෙලා වැඩ කලා.කුරුවිට 10 එක්ක .සියළු ගෙවල්වලට ගියා.ඒ අය සහාය දෙන බව කිව්වා.චකිතයක් තිබ්බා.කකුලෙන් අදින ප්‍රමාණය වැඩියි.කුහකකම තේරුම්ගත්තා.විශ්වාස කලා.එදා උදේත් සහාය දෙන බව කිව්වා.නමුත් තේරුම්ගත්තා මුලාවේ බොරුවේ තත්වය.පෞද්ගලික විශාල මුදලක් වැයකලා.පක්ෂය වෙනුවෙන් දරදිය ඇද්දේ අපි.

(මේ අවස්ථාවේ සභාවේ ගෝෂාව පැවතිණි) ගලුකාගමට සාධාරණයක් කරන්න ඕනි.ඒනිසයි මම මේ සභාවට ඉදිරිපත්වුනේ.ගරු සභාපතිතුමා ගිය වර්ෂවල සභාවේ ඉන්නකොට කිසිවකට සහාය දුන්නේ නෑ. නමුත් නමුත් අපි එහෙම නෑ.විනිවිදව කරන යහපත් නිවැරදි දේට සහාය වෙනවා.මේ සභාවට 45 ක් ඇවිත් ඉන්නවා. ඒ අයටත් සංවර්ධන කටයුතු වලදී සහාය වෙන්න. ප්‍රතිපාදන දෙනකොට තම පිරිසට විතරක් නෙමෙයි ඒ අයටත් දෙන්න.මේ පත්වෙලා ඉන්න මන්ත්‍රීතුමන්ලා කොට්ඨාශවලට යනකොට නිලධාරීන් දැනුවත් කරන්න.සභාවේ වාහන අරන් ගිහින් අකටයුතු කලා.ප්‍රථම වතාවට ඉවසුවා.කිසිදු අවසරයක් නැතිව අනුන්ගේ ඉඩම් පාරවල්

ගස් කපන්න එපා.නිලධාරීන් දැනුවත් කරන්න.මම නමින් කියන්නෑ.ඉදිරියේදි එවැනි දේ එපා.ලාල්කාන්ත මහතා කියපු විධිහට විනිවිදව කටයුතු කරන්න.අද ඉඳන් සභාවේ නිවැරදිව විනිවිදව කරන සියළු කටයුතු වලට සහාය දෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා .-</u>

ගරු සභාපතිතුමා ,උපසභාපතිතුමා ,ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ශ්‍රී ලංකා පොදුජන පෙරමුන නියෝජනය කරමින් පත්බේරිය කොට්ඨාශයෙන් මෙම සභාවට දෙවන ලයිස්තුවෙන් පත්වුනේ.මම මා වෙනුවෙන් ජන්දය ලබාදුන් පත්බේරිය වසම ඇතුළු තලාවිටිය,පරකඩුව,පොහොරබාව කොට්ඨාශ වල ජනතාවට මාගේ ස්තුතිය පල කරනවා. පත්බේරිය අපේ මහේෂ් නාපාවල මන්ත්‍රීතුමා සිටිනවා.එතුමා පත්බේරිය දිනුවා.සහයෝගයෙන් කටයුතු කරමු. 5 වන වරට මේ සභාවට පත්වුනේ. අපේ ප්‍රෙද්ශයේ ,කොට්ඨාශයේ ජනතාවගේ සිතුම් පැතුම් හදුනාගෙන ඔවුන්ගේ උපතේ සිට මරණය දක්වා වන සියළු අවශ්‍යතාවන් සදහා සභාවෙන් මැදිහත්වීම සිදුවනවා.ඒ ඒ කාලවල ජනතාවට සේවය කිරිමට මට අවස්ථාව ලබාදීමට මැදිහත්වූ ගරු මහින්ද රාපක්ෂ මැතිතුමා,ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය,ගරු රංජිත් බණ්ඩාර මැතිතුමා ට ස්තූතිය පල කරමි.එසේම හිටපු ගරු සභාපති ප්‍රේරත්න මල්කැකුළ මහතාටත් ස්තුතියි.පත්ෂ නායක නාමල් රාජපක්ෂ මැතිතුමාට ස්තුතියි.ප්‍රේමලාල් ජයසේකර මැතිතුමාව සිහිපත්කරනවා.ජනතාවට ප්‍රයෝජනවත් සියළු දේට සහාය වෙනවා.2006 මේ සභාවට එද්දි අපේ ගමට සෞඛ්‍ය මධ්‍යස්ථානයක් නෑ.තැපැල් කාර්යාලයක් නෑ.ජනතාවට ඒ පහසුකම් නංවන්න හිටපු සභාපතිතුමා සහාය උනා.ස්තුතියි.පරකඩුව සතිපොල හදන්න ඉඩමක් ගත්තා.විශාල වටිනාකමක් තියෙන ඉඩමක්. ඉදිකරන සතිපොල තුලින් සභාවට ප්‍රාග්ධනය ගන්න පුළුවන්.

පසුගිය කාලයේ සිටම ප්‍රෙද්ශයේ ජනතා ජීවිතය නංවා සිටුවන්න සහාය දුන් හිටපු ලේකම්තුමිය,වර්තමාන ලේකම්තුමාටත් ප්‍රාදේශිය ලේකම් තුමා,ස්වේච්ජා සංවිධාන,ආදී සියළු නිලධාරින්ට ස්තුතියි.ජනතා සේවයට සභාවට පත්වී ආ සියළු දෙනාට සුභ අනාගතයක් පතමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා .-</u>

ගරු සභාපතිතුමා ,උපසභාපතිතුමා ,ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මාධ්‍ය මහතුන් ,කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මුළු බලප්‍රෙද්ශයේ ම සිටින එක්ලක්ෂ පනස්දාහකට ආසන්න ජනතාවගෙන් මේ 46 දෙනෙකු පත්වෙලා මේ සභා නියෝජිතයින් ලෙස සහභාගී වීම මම හිතනවා දෛවයේ එක් වාසනාවක් කියලා. කුඩාහෝ ලොකු හෝ අපි කරන ජනතා සේවය ඇත්තටම වැදගත්. මම 1991 අත ලකුනෙන් ජන්දය ඉල්ලුවත් බැරිඋනා.97 දි බුලත් කොළයෙන් ඉල්ලා 6 වන තැනට පත් උනා.මන්ත්‍රිවරු 22 යි.22 දි බුලත්කොළයෙන් ඉල්ලලා විපක්ෂ නායක උනා.ඊට පස්සේ පොහොට්ටුවෙන් ඉල්ලලා වසර 10ක් සභාපති උනා.ආරම්භයේ සිටම මේ දක්වා ජනතා සේවය කිරිමට මා හට සහාය දුන්න ජන්දය දුන්න ඒ ජනතාවට මම ස්තුතිය පල කරමි.දේශපාලන වෙනස්වීම් එක්ක උපසභාපතිතුමාට ,ඉනෝකා මන්ත්‍රීතුමියට මට පුටුව ලකුණ ලැබඅනේ.අපි හිටියේ පොහොට්ටුවේ.ගියවර දේශපාලන මතයත් එක්ක මහා කැපවීම් කලත් පසුගියවර පොහොට්ටුවෙන් බැකියලා අපි තුන්දෙනා ඒකාබද්ධ වෙලා ජන්දය ඉල්ලමු කීවා.පවිත්‍ර මැතිනිය පුටුව ලකුණ දුන්නා.පසුගිය ප්‍රාදේශීය සභා ජනතා සේවය කල වසර 28 තුල ආ ගමන් මග හොඳ නරක සියල්ල තියෙනවා.ඒ හොඳ නරක සියල්ලටම උත්තර දෙන්න ඇහුම්කන්දෙන්න සූදානම්. අපි පසුගිය සභා කාලයේ කොට්ඨාශ සාධාරන ලෙස බෙදෙන්න ඕනි කියලා.පුද්ගලික ව.බහුතර ඉල්ලීමට එකඟ වෙලා කටයුතු කලා.නොයෙක් දේ අහගෙන අනිත් අයටත් උදව් කලා.හැම කෙනෙක්ම පත්වූ කොට්ඨාශයට යමක් කල යුතුයි.අපි එදා ආරම්භ කලා කුරුවිට සම්මන්ත්‍රණ ශාලාව.1500 න් විතර ජනතාවකට එකතු වෙන්න හැකි තැනක්.අඩුපාඩු

තියෙනවා.දේශීය ණය ගන්න ගියාට ගන්න උනේ නෑ.ලක්ෂ 800 විතර ඉතිරි කරලා ගියා.හිතුවා මේ සම්මන්ත්‍රණ ශාලාව හදයි කියලා.නමුත් බැරිඋනා.අපි සහාය දෙනවා.මේවා හදමු. කුරුවිට ට වැඩ කරමු.පුස්තකාලය හැදුවට එහිත් අඩුපාඩු තියෙනවා.පහසුකම් මදි.ඉතිරි වැඩ කරමු.සම්පත් මන්ත්‍රීතුමා කීවා වගේ වටප්පිටිය පරකඩුව ජනතාවට සතිපොලට පර්චස් 97 ක් මිලට ගත්තා.ලන්ෂ 17 ක් ගෙවලා.පොල හදන්න බැරිඋනා.පාසැල,ආසන්නයේ.ඒ ජනතාවට එකතුවෙලා කතාකරන්න තැනක් නෑ.මේ දේවල් කරන්න සභාවට තනිව බැරිවෙයි.ආණ්ඩුව සහාය කරගෙන ඒ ශක්තිය ගන්න වෙයි.පොහොරබාවෙන් අක්කර 10 ක් ගත්තා.කෝටි දෙකක් විතර වියදම්කලා.ඒ ස්ථානය හොඳට හැදුවා.විදුලිය ගත්තා.ව්‍යාපෘතිය නිසිපරිදි ක්‍රියාත්මක විය යුතුයි.අපිට අයිති නැති බිමකට විශාල වියදමක් දරලා.බන්ධනාගාර භූමියේ.ඒදා ඒක ආරම්භ කලේ රාජ්‍ය නොවන සංවිධානයක ආධාරත් අරන් ආධාරකරලා කසළ පෝර බවට පත්කරලා අලෙවිත් කලා.අපි පහසුකම් දුන්නා.මේ පොහොරබාව ඉඩම  අක්කර 10 ක්. ඉඩම අපේම බිමක්.රැකියා බිහිකරලා අපිට ඒවැඩේ සාර්ථකව කරන්න හැකිවේවි.සභාවට නිතිඥයෙක් ගත්තා.මාසෙකට විශාල වියදමක් දරනවා මේ සභාවේ නඩු වලට.ලක්ෂ ගානක් වැයකලා.විමර්ශනය කරලා අපිට ගෙවන්නළු.මට ලක්ෂ දෙකක් විතර.ලේකම්ට ලක්ෂයක් විතර යයි.මේක සද් භාවයෙන් කලේ.මම ගෙවන්නේ නෑ.නඩු දාන්නඕනි.අනුන්ගේ තැන්වලට වියදම් කලේ කොහොමද?වියදම් කලාට නඩු දාමු.වරිපනම් සීමාව දිර්ඝ කලා.මාර්ගයේ මධ්‍ය ලක්ෂයේ සිට මිටර් 150 දෙපැත්තට.පුස්සැල්ල ජනතාව  අකැමැති උනා.එක් මන්ත්‍රී වරයෙක් කිව්වා පාර හැදුවේ නෑළු.කොතනද පාර හැදුවේ නැත්තේ?.තමන් එන පාරත් හැදුවේ සභාවෙන්.නව සභාපතිතුමාගෙන් උදව් ගන්නද එහෙම කියන්නේ?.ඒ තත්වය හොඳනෑ.ඊලගට විජේසිරි මන්ත්‍රීතුමා කීවා අපිට කොට්ඨාශ 3යි.පුටුවට.අපිට සභාපති කම ගන්නබෑ.නමුත් කුරුවිටට යමක් කලහැකි කෙනෙක් ඉන්න ඕනි.ඇත්තටම විපක්ෂනායක තුමා මගේ මිත්‍රයා.නමුත් තේරුම් ගත්තා මේ සභාවේ සභාපතිකම ගන්න බෑ කියලා.කුරුවිටට සෙතක් විය යුතුයි.අපේ ඉල්ලීම් නෑ.නමුත් ජනතා අවශ්‍යතා තියෙනවා.ඒ නිසා ජනතාවටසේවය කරන්න  සවියක් වෙන්න අපි මේ සභාව අවසන් වනතුරු අපි සහාය දෙනවා. ලොකු හොරා පොඩිහොරා කියලා කියනවා.ලොකු බලාපොරොත්තු නැති උනාමයි එහෙම කියන්නේ.පාරවල්හදන් නැතුව සල්ලි අරන්ලු.විමර්ශනයක් කරන්න.ඊලඟසභාවට කියන්න.මේ සභා ශාලාව හැදුවා.උසස් තත්වයකින් දැන් සතුටුයි.ආපු ගමන ගැන.කවුරුවත් ආවේගශිලිව බොරු කියන්න එපා.විසල් ජල ක්‍රමයෙන් කැඩුන ඇතැම් පාරවල් හදන්න මුදල් ඉතුරු උනේ නෑ.පුස්සැල්ල මෙනේරිපිටිය අවුරුද 2 ක් ගියා පාර කැඩිලා.හදපු නැති තැන් තියෙනවා.මේ තැනට ආවේ මම නැවත කියනවා දෛවයේ වාසනාවකට.ඒ නිසා ජනතාවට වැඩකරමු.නිවැරදි තින්දු තීරණ ගන්න හොඳම තැන මෙතැන.ගරු සභාපතිතුමණි.මේ වසර 4 ට අපි ජනතාව වෙනුවෙන් වැඩ කරන්න දිය හැකි උපරිම සහාය ඔබට ලබාදෙනවා.ජයවේවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා .-**

සියළු දෙනාගෙන් අවසරයි.මම 1991 මේ සභාවට ආවේ.ඇවිත් අවුරුදු 34 ක් එක දිගට මේ සභාවේ . විපක්ෂේ හිටියේ. ගිය සභාවේ උනත් විපක්ෂයේ වගේ තමා හිටියේ.පාසැල් කාලයේ ඉඳන් ශිෂ්‍ය දේශපාලන කටයුතු වලට ගියා.ඒ ශිෂ්‍ය ව්‍යාපාර වලට ගියා.මෙවර ස්වාධීන 2 මගින් තරඟ කරලා  මේ වරත් සභාවට පත්උනා.ජන්දය දුන් සැමට ස්තුතියි. මගේ ගුරුවරයා නාලන්ද එල්ලාවල මැතිතුමා.සුරංගනී එල්ලාවල මැතිණිය.මගේ නම පවා දේශපාලන බිමට ගැලපෙන ලෙස හැදුවා.උදව් කල සැමට ස්තුතියි.නවක මන්ත්‍රීවරු එන එක හොඳයි. නමුත් පිරිස වැඩියි.91

දි 22යි.දැන් ගොඩක් වැඩියි.මේ ශාලාව ට 46 ක් වැඩියි.මහජන ගැලරිය අඩුවෙලා.යන්නත් අමාරුයි.ගොඩනැගිල්ල ලොකු කරමු.මේ ජන්ද ක්‍රමයත් වෙනස් වෙන්න ඕනි.ගමන් වියදම් දුරකථන දීමනා මුදල මදි.ප්‍රතිපාදන මදි.91 දි තිබුනේ රු.5000.00 කට අඩියි.3500 යි ගිනුමේ තිබුනේ.වාහන නෑ.විල්බැරැක්ක තිබුනේ.ඒ නිසා අපි එකතු වෙලා 1997 වෙද්දි වාහන ගත්තා.ඉස්සර පුටු 22 යි සභාවටම තිබුනේ.අද වෙනකොට කෝටි ගානක දේපල සභාව සතුයි. කෝටි ගානක මුදල් තැම්පතු තියෙනවා. සභාවේ නඩු වලට විශාල මුදලක් යනවා.නිතිඥ ගාස්තුව විශාලයි.ඉතා අඩු මදලකට ඒසදහා නීතිඥ සහාය ගත්තත් ඒක අධිහාර වෙලා.නිලධාරී ග්‍රහනයට අපි යටවෙලා.ව්‍යවස්ථාව පෙන්නලා අපිව කොටු කරලා.මේ නගරයේ මිනිස්සු අසාධාරන විධිහට නඩු වලට පැටලිලා.සුළු අඩුපාඩු හදලා ඒවා අවසන් කරමු.වරිපනම් අගය වැඩියි.තක්සේරුව අනුව 6% ට දැනෙන්නෑ. නමුත් වැඩි උනොත් විශාල ගානක් ගෙවන්න වෙනවා.මම කියන්නේ 3% ට ඇති කියලා.මම සුබ පතනවා මේ සභාව ලංකාවේ අංක 1 ට ගන්න හැකිවෙන්න කියලා. අපිට ජන්ද 2 යි තිබුනේ. නමුත් ඒක 6 x 12 කරලා පෙන්නුවා.මං ගරුසභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා ලේකම්තුමාට දැනුම්දෙනවා මේ මන්ත්‍රිතමන්ලාට සාමදාන විනිශ්චයකාර තනතුරු ගක්ක පුළුවන්.රෙජිස්ට්‍රාර් තුමා හමුවෙලා සාකච්ජා කරලා ඒ කටයුතු සිදුකරගන්න.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා .-</u>

අවසරයි.අපි මේ සභාවට ආවේ ජනතා අභිලාෂ ඉටුකරන්න.ජනතා අභිලාෂ කා තුලත් විවිද ලෙස තියෙනවා.මම 1997 සිට සමසමාජ පක්ෂයෙන් පත්වෙලා අද දින දක්වා ඉන්නවා මේ සභාවේ. මේ සභාවේ මගේ දේශපාලන දර්ශනයෙන් පිටපරිබාහිර කටයුතු වලට මම එකඟ නෑ.මම ජනතාව පැත්තේ හිටගත්ත කෙනෙක්.මන්ත්‍රි ධූරයෙන් නෙරපුවත් මම එහෙමයි.1997 දි මට හිතුනා කොට්ඨාශ ක්‍රමය හොඳයි කියලා.සමහරු විරුද්ධ උනා.අවුරුදු 28 ක කාලයක් මම පනතේ ගුණාංග ප්‍රයෝජනයට ගෙන ජනතාවට සහාය උනා.අපි අත්දැකීම් බෙදාහදාගනිමින් ඉදිරියට යමු. සමහරු මේ සභාවේ ඉන්නවා හැකියා අතින් ඉතාමත් ඉදිරියෙන්.භාෂා හැසිරවීම ඉතා ඉහලයි.චන්ද්‍රකුමාර් මන්ත්‍රිතුමා අගය කරනවා.ඔබේ භාෂා හැකියාව පිලිබඳව.මේ පනතේ තියෙන කාරක සභා තුලින් ඉහල අගයක සේවයක් ඉටුකල හැකියි.ඇහැලියගොඩට ජනතාවට නායකත්වයක් අවශ්‍යා නිසා පුටුවට ජන්දය දුන්නා.මගේ ප්‍රතිපත්තිවලට ඉඳුරාම වෙනස් අයට මට අත ඔසවන්න බෑ.මම මේ වසර 30 ක කාලය තුල සීලාචාරව දේශපාලනය කරා.පුද්ගලික චරිත ඝාතන කලේ නෑ.මම වෘත්තිය කම්කරුවෙක්.කලින් රාජ්‍ය සේවයේ හිටියා.නමුත් උපාධියක් නෑ.නීතිය පිලිබඳව ඩිප්ලෝමාවක් තියෙනවා.මම මේ සභාවේ උන්නතිය වෙනුවෙන් කල හැකි සියල්ලකලා.ගියවර අපි සභාවෙන් යනකොට කෝටි ගානක මුදලක් ඉතිරිව තිබුනා.අවභාවිතා කලේ නෑ.මට දරුවෝ නැහැ දැන්.මේ සභාවේ වෙබ් අඩවිය මගේ දරුවා තමා හැදුවේ නොමිලේ.

යමෙක් හොරකමක් කලා නම් ඒකට නීතිය තියෙනවා.විවෘතව විභාග කරන්න.අපි නඩු වලට ගිහින් තියෙනවා. හැබැයි මේ සභාව වෙනුවෙන්.තම දේශපාලනයට අවනත නොවුන පලියට යමෙකුට දේශපාලන පලිගැනීම් කරන්න එපා.සහෝදරත්වයට කැලලක්.අවුරුදු 30 ක් එකට හිටිය අය මූණ බලන්නැතිව ඉන්න තත්වෙට පත් වෙන්න එපා.මේ සභාවේ පළාත් පාලනය පිලිබඳව පූර්ණ අවබෝධය තියෙනවා. ඒ තුලින් ශක්තිමත් පළාත් පාලනයක් බිහිකරමු. ඒල්ලාවල කිරිඇල්ල ජනතාවට නැවතත් ස්තූතියි.මට කිවයුතු තවත් දෙයක් තියෙනවා දීර්ග කාලයක් රෝගාතුරව සිටි අයි. කේ.කුලරත්න මන්ත්‍රිතුමා අභාවයට පත්උනා.ඒ පිලිබදව ශෝකය

ප්‍රකාශ කරනවා.එසේම සිරිපාල වීරසේකර හිටපු උප සභාපතිතුමා අභාවයට පත් උනා.ඒ පිලිබඳව ත් සංවේගය පලකරනවා.

මෙහිදි **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා ද** අයි. කේ.කුලරත්න මන්ත්‍රීතුමා, සිරිපාල වීරසේකර හිටපු උප සභාපතිතුමා ගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා .-**

උප සභාපතිතුමණි, ගරු මන්ත්‍රීවරුණි, මාධ්‍ය හිතවතුණි, අපි හැමෝම ඇවිත් ඉන්නේ මහජනතාවගේ ජන්දය තුලින්.හැමෝටම වටිනාකමක් තියෙනවා.ඒ වගේම හැමෝම ජනතා බලාපොරොත්තු ඉටුකිරීමට බැඳී සිටිනවා.2018 මම කඳන්ගොඩ කොට්ඨාශයෙන් ජන්දය ඉල්ලා ඒ එනකොට සභාපති වීමේ අභිලාශයක් තිබුනේ නෑ.නමුත් අපි පක්ෂයේ වගකීම් ඉටුකලා.තනතුරු දෙන්න කියලා නෑ.වගකීම් ඉටුකලා. මේවන විට ඒ වගකීම් රාශියක් ඉටුකල පක්ෂයේ ජය වෙනුවෙන් දරදිය ඇදපු පිරිසක් අද ජීවතුන් අතරත් නෑ.අපි පුද්ගලික ලාභ බලාපොරොත්තු උනේ නෑ.දිවි නොතකා යහපත් සමාජයක් ගොඩනගන්න කටයුතු කලා.විවිධ අයුරින් ඒ සඳහා දායක උනා. අනාගත පරපුරට සංවර්ධිත රටක් උරුමකරදීමයි බලාපොරොත්තුව.ඒ නිසා අපි කුරුවිට කිරිඇල්ල සියළු ප්‍රදේශ සංවර්ධනය කරලා ජනතා බලාපොරොත්තු ඉටු කරමු.අපි දේශපාලන තුලින් රටේ බලය ගත්තා.සභාවේ බලය ගත්තත් ජය තහවුරුකිරීමට ගැනීමට අපිට විවිධ ක්‍රම අනුගමනය කරන්නඋනා.මේ සියළු දෙනා සභාවේ ගරු මන්ත්‍රී වරුන් මන්ත්‍රීතුමියන් එකතු වෙලා ප්‍රජාත්‍රාන්ත්‍රවාදි ලක්ෂණ අදහස් දක්වලා පක්ෂ විපක්ෂ අදහස් අරන් කටයුතු කරමු.උපසභාපතිතුමා,මන්ත්‍රී මඩුල්ල.කාර්යමණ්ඩලය මානව සම්පත් තියෙනවා.මේ අයගේ අත්දැකීම් අරගෙන ජනතාවට ජීවත් විමට යහපත් හොඳ දේශයක් බවට පත්කරමු.ඒ සඳහා සියළු දෙනා සහාය දෙන්න.මා නියෝජනය කරන කඳන්ගොඩ කොට්ඨාශයේ ජනතාවට නැවතත්ස්තූතියි.එසේම අයි.කේ.කුලරත්න හිටපු මන්ත්‍රීතුමා සහ හිටපු උප සභාපති සිරිපාල වීරසේකර මහතාගේ අභාවය වෙනුවෙන් එතුමන්ලාගේ පවුලේ සැම වෙත ශෝකය පල කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ලීලානන්ද මහතා-</u> **පසුගිය පළාත් පාලන මැතිවරණයෙන් මා කොස්ගොඩ කොට්ඨාශයෙන් තරඟ වැදී ජයගත්තා.මේ ජය පුද්ගලිකව නොව සමගි ජන බලවේගය එක්ව ලැබූ පොදු ජයක්. නමුත් මේවන විට මාහට දැනුම්දීමක් ලැබුණා සබරගමුපළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපතිධුරය ට මා පත්කර ඇති බවත් එම වගකීම භාරගන්නා ලෙසත්. ඒ අනුව මාහට මෙම වගකීම භාරගන්න වෙනවා.පක්ෂයේ සංවිධායකවරයෙකු ලෙස මම මේ කුරුවිට ප්‍රාදේශිය සභාවට අදාල කටයුතු වලට සහාය වෙන්නම්.නමුත් මට මහජන නියෝජිතවරයෙක් ලෙස තව දුරටත් සභා කටයුතුවලට පැමිණීමට නොහැකි වෙයි.පළාතේ පොදුප්‍රවාහන සේවා කටයුතු නංවාලන්න සේවාව ඵලදායීකිරිමට මම ඒ වගකීම භාරගන්නවා.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා</u>

**සියළු කටයුතු වලට එතුමාට සුභ පතනවා.**

**06.** **යථා පරිදි කල් දී ඇති යෝජනා**

06- 1. <u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u> - 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ නියම කර ඇති විධිවිධානයන්ට අනුව 2025 වර්ෂය සඳහා **කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම් පැවැත්විය යුතු දිනයන් පිළිබඳ මහා සභා තීරනයක් ලබාගැනීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා:-</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.සෑම මසකම දෙවන ඉරිදාට පසුව එන අඟහරුවාදා දින පැවැත්වීම සුදුසුයි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>**

**එම දිනය සුදුසුයි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා :-</u>**

**එම දිනය පහසුයි.අනෙකුත් වාර්තා ඉදිරිපත්කිරිමට කාලය වගේම න්‍යාය පත්‍රයට යෝජනා ආදිය දීමටත් එසේ යෙදීම පහසුයි.**

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ නියම කර ඇති විධිවිධානයන්ට අනුව 2025 වර්ෂය සඳහා **කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම් සෑම මසකම දෙවන ඉරිදාට පසුව එන අඟහරුවාදා දින පෙ.ව.9.30 ට සභාරැස්වීම් ශාලාවේදී පවත්වමු.එසේ පැවැත්වීමට තීරණය කල දිනය රජයේ නිවාඩු දිනයක් වන්නේ නම් රීති ප්‍රකාරව අනුගාමී වැඩ කරුනු ලබන දිනයේ රැස්වීම පැවැත්වේ.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව** 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ නියම කර ඇති විධිවිධානයන්ට අනුව 2025 වර්ෂය සඳහා **කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම් සෑම මසකම දෙවන ඉරිදාට පසුව එන අඟහරුවාදා දින පෙ.ව.9.30 ට සභාරැස්වීම් ශාලාවේදී පැවැත්වීමටත් එම දිනය රජයේ නිවාඩු දිනයක් වන්නේ නම් රීති ප්‍රකාරව අනුගාමී වැඩ කරුනු ලබන දිනයේ රැස්වීම පැවැත්වීමටත් ඒකමතිකව සභා තීරණය විය.**

**06-2.** <u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u> **-2025** **වර්ෂයට අදාලව 1987 අංක 15 දරණ** ප්‍රාදේශිය සභා පනතේ 12 වගන්තිය යටතේ **කුරුවිට ප්‍රාදේශීය සභාව සඳහා පහත කමිටු හා කමිටු සාමාජිකයන් පත්කිරිම.**

**1.මුදල් කමිටුව :-කුරුවිට** ප්‍රාදේශිය සභා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටුව නමින් කමිටුවක් විය යුතු යන්නත් ප්‍රාදේශිය සභාවට අදාළ අරමුදල් හා ආදායම්, වියදම් හා ප්‍රසම්පාදනය පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබා දීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින් කල පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම මෙම කාරක සභාවේ කාර්ය විය යුතුය යන්නත්,එම කාරක සභාව සඳහා ප්‍රමාණවත් සාමාජික සංඛ්‍යාවක් පත් කිරීමටත් යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ලීලානන්ද මහතා :-**

එම යෝජනාව ස්ථිර කරමි.මෙම කමිටුව සඳහා සාමාජිකයින් හත්දෙනෙකු නම්කර යොදාගැනීම ප්‍රමාණවත්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය.**

**එසේ කිරීම සුදුසුයි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

පනතේ කමිටු හතරට මන්ත්‍රීවරුන් එක් අයෙකු බැගින් නියෝජනය විය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-**
පනතේ ප්‍රධාන කාරක සභා හතරට සියළු මන්ත්‍රීවරුන් නියෝජනය විය යුතුයි.මේ කමිටු වලට මාව පත්කරන්න එපා.මේක ඉල්ලීමක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා :-**

සාමාජිකයන් නමය බැගින් යොදාගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා :-**

මෙම කමිටු වලට සාමාජිකයින් වැඩි ප්‍රමාණයක් යොදාගැනීමෙන් කමිටු වල සනපූර්නය සකසාගැනීමේදි අපහසුතාවක්.සනපූර්ණය නොමැතිව කමිටුව පවත්වන්නට බෑ. ප්‍රායෝගිකව යම් අපහසුතාවක් සිදුවෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා :-**

නමුත් එලියේ බොහෝ දක්ෂ පිරිසක් ඉන්නවා.ඒ අයවත් අවශ්‍යතාවය අනුව පත්කර ගමු.ඒ අයට අවස්ථාවක් දීම තුලින් මෙම සභාවට ලොකු සේවයක් ගන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-**
මෙම කමිටු ඉතා වැදගත්.මේවා තුලින් මහ සභාවට නිවැරදි නිර්දේශ මගපෙන්වීමක් ලැබෙනවා.එසේම බාහිර පුද්ගලයින් සම්පත්දායකයින් යොදාගැනීමත් වැදගත්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ලීලානන්ද මහතා :-**

සාමාජිකයින් 07 ක් යොදා ගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා :-**

**කුරුවිට** ප්‍රාදේශීය සභා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටුව සඳහා ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා,ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ජයලාල් මහතා,** ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ලීලානන්ද මහතා,** ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය,විද්‍යා හා තාක්ෂණ අමාත්‍යංශයේ වරලත් ගණකාධිකාරි ප්‍රදීප් හුලංගමුව මහතා සුදුසුයි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-
යෝජනාව ස්ථිරයි._ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතාවද පත්කරමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද පුෂ්පකුමාර මහතා :-

මෙම කමිටුවට ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී** මංගල ඩයස් මහතා, ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී** සම්පත් බොතේජු මහතා සහ ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී** කැළුම් ධර්මදාස මහතාව පත්කරමු.

කාරක සභාව සඳහා නිලධාරීන් පත්කිරීම සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ජාව සිදුකෙරුණ අතර යෝජනා කල නම් අතුරින් සංශෝධනය කර පහත පරිදි කාරකසභාවට සාමාජිකයින් නම්කරන ලදී.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා

මුදල්කමිටුව සඳහා සභාපතිවරයා ඇතුලත්ව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා,_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ලීලානන්ද මහතා** ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා,** ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී** කැළුම් ධර්මදාස මහතා සහ **විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ වරලත් ගණකාධිකාරි ප්‍රදීප් හුලංගමුව මහතා ඇතුළුව සහා ලේකම් වරයා කමිටුව සඳහා පත්කරගමු.මෙම කමිටුව අවශ්‍යතාවය පරිදි හා කලින් දැනුම් දීමක් සිදුකර රැස්වෙමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු ව **කුරුවිට** ප්‍රාදේශිය සභා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටුව නමින් කමිටුවක් විය යුතු යන්නත් ප්‍රාදේශිය සභාවට අදාළ අරමුදල් හා ආදායම්, වියදම් හා ප්‍රසම්පාදනය පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබා දීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින් කල පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම මෙම කාරක සභාවේ කාර්ය විය යුතුය යන්නත්,එම කාරක සභාව සඳහා සාමාජිකයින් ලෙස ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා , ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා,_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ලීලානන්ද මහතා** ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා,** ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී** කැළුම් ධර්මදාස මහතා , **විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ වරලත් ගණකාධිකාරි ප්‍රදීප් හුලංගමුව මහතා සහ සභා ලේකම් වරයා ද ඇතුලත්ව කමිටුව පිහිටුවීමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.**

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා

**2. කාර්මික සේවා කමිටුව:- කුරුවිට** ප්‍රාදේශිය සභා කාර්මික සේවා කමිටුව නමින් කමිටුවක් විය යුතුය යන්නත් ප්‍රාදේශිය සභාවට අදාළ බල ප්‍රදේශයේ භෞතික හා ආර්ථික සංවර්ධනය,යටිතල පහසුකම් හා නඩත්තු කටයුතු පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබා දීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින් කල පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම මෙම කාරක සභාවේ කාර්ය විය යුතුය යන්නත්,එම කාරක සභාව ට ප්‍රමාණවත් සාමාජික සංඛ්‍යාවක් පත් කිරීමටත් යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා :-

එම යෝජනාව ස්ථිර කරමි. කාර්මික සේවා කාරක සභා කමිටුව සඳහා **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයලත් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ටී.අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා සහ මෝටර් රථ විශේෂඥ ඩබ්.ජයතිස්ස මහතා සුදුසුයි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මෙම කමිටු සඳහා කාගේත් අදහස් ගන්න.එකම ටීම් එකක් නැතුව යෝජනා ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රංජන් ප්‍රදීප් මහතා :-

මෙම කාරක සභා පත් කිරීමේ කටයුත්තට මහා සභාව කාරක සභාවක් වෙමුද?එය පහසුයි.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා

එය අවශ්‍ය වන්නේ නැහැ.මෙම කටයුත්ත සභාව තුළම සිදුකරගතහැකියි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-

මල්කැකුළ මන්ත්‍රීතුමා කිව්වා වගේ කාගේත් අදහස් ඇතුව විවිධ පාර්ශව මෙම කමිටු වලට යොදාගත යුතුයි.පරිබාහිර අයත් ගැනිම සුදුසුයි.හැකියාව ඇති දක්ෂ අය ගත යුතුයි.කැපවීම තිබියයුතුයි.පසුගිය කාල පරිච්චේදයදිත් අපේ රන්ජන් ප්‍රදීප් මන්ත්‍රිතුමා විශාල කැපවීමන් කලා මේ කාර්මික කමිටුවේ කටයුතු සඳහා.ඒ අනුව එතුමාත් මෙම කමිටුවට පත්කිරීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ.දයාවතී මිය :-

කාර්මික කමිටුව සඳහා **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රංජන් ප්‍රදීප් මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා,එම්.ඩග්ලස් පේමදාස මහතා, වද පත්කරමු.**

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා

**මෙම සභාවේ කාර්මික කමිටුව සඳහා සභාපතිවරයාවද, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයලත් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා, , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා සහ මෝටර් රථ විශේෂඥ ඩබ්.ජයතිස්ස මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රංජන් ප්‍රදීප් මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා, සහ ලේකම්වරයා ,කාර්මික නිලධාරී ටී.ආර්.රන්ජන් කීර්ති මහතා ඇතුලත්ව පවත්වාගමු. මෙම කමිටුව අවශ්‍යතාවය පරිදි හා කලින් දැනුම් දීමක් සිදුකර රැස්වෙමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු කුරුවිට ප්‍රාදේශිය සභා කාර්මික සේවා කමිටුව නමින් කමිටුවක් විය යුතුය යන්නත් ප්‍රාදේශිය සභාවට අදාළ බල ප්‍රදේශයේ භෞතික හා ආර්ථික සංවර්ධනය,යටිතල පහසුකම් හා නඩත්තු කටයුතු පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබා දීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින්

කල පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම මෙම කාරක සභාවේ කාර්ය විය යුතුය යන්නත්,එම කාරක සභාව සභාව සඳහා **සභාපතිවරයාවද, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයලත් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා සහ මෝටර් රථ විශේෂඥ ඩබ්.ජයතිස්ස මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රංජන් ප්‍රදීප් මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා, සහ ලේකම්වරයා ,කාර්මික නිලධාරී ටී.ආර්.රන්ජන් කීර්ති මහතා ඇතුලත්ව කමිටුව** පිහිටුවාගැනීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.**

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

**3. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව:-** කුරුවිට ප්‍රාදේශීය සභා නිවාස, පොදු උපයෝගිතා හා ප්‍රජා සංවර්ධන කමිටුව නමින් කමිටුවක් විය යුතු යන්නත් ප්‍රාදේශිය සභාවට අදාළ බල ප්‍රදේශයේ නිවාස,පොදු උපයෝගිතා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබා දීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින් කල පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම මෙම කාරක සභාවේ කාර්ය විය යුතුය යන්නත්,එම කාරක සභාවට ප්‍රමාණවත් සාමාජික සංඛ්‍යාවක් පත් කිරීමටත් යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් පතිරණ මහතා :-</u>**

එම යෝජනාව ස්ථිර කරමි.නිවාස,පොදු උපයෝගිතා හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා මල්කාන්ති ලියනගේ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.ගයාන් වික්‍රමසූරිය මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා, ව පත්කරමු.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ.ඉනෝකා මල්ලවආරච්චි මිය ව එම කමිටුවට පත්කරමු.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රොෂාන් මධුශංක දේශප්‍රිය මහතා :-</u>

නිවාස පොදු උපයෝගිතා හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර මහතා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් එදිරිසිංහ මහතා ව පත්කරමු.**

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා

ඒ අනුව මෙම සභාවේ නිවාස,පොදු උපයෝගිතා හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා මල්කාන්ති ලියනගේ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.ගයාන් වික්‍රමසූරිය මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් එදිරිසිංහ මහතා ව පත්කරමු.**

**මෙම කමිටුව අවශ්‍යතාවය පරිදි හා කලින් දැනුම් දීමක් සිදුකර රැස්වෙමු.** ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු කුරුවිට ප්‍රාදේශීය සභා නිවාස,පොදු උපයෝගිතා හා ප්‍රජා සංවර්ධන කමිටුව නමින් කමිටුවක් විය යුතු යන්නත් ප්‍රාදේශීය සභාවට අදාළ බල ප්‍රදේශයේ නිවාස,පොදු උපයෝගිතා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබා දීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින් කල පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම මෙම කාරක සභාවේ කාර්ය විය යුතුය යන්නත්,එම කාරක සභාවට සඳහා සභාවේ සභාපතිවරයා, **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා මල්කාන්ති ලියනගේ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී .එම්.ගයාන් වික්‍රමසූරිය මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර මහතා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් එදිරිසිංහ මහතා,ලේකම්වරයා ඇතුලත් ව කමිටුව පිහිටුවා ගැනීමටත් ඒකමතිකව සම්මත විය.**

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා

**4. පරිසර හා පහසුකම් කමිටුව:-** කුරුවිට ප්‍රාදේශිය සභා පරිසර හා පහසුකම් කමිටුව නමින් කමිටුවක් විය යුතුය යන්නත් ප්‍රාදේශිය සභාවට අදාළ බල ප්‍රදේශයේ මහජන **සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා හා ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබාදිම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින් කලට පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරිම මෙම කාරක සභාවේ කාර්ය විය යුතුය යන්නත් එම කාරක සභාවට ප්‍රමාණවත් සාමාජික** සංඛ්‍යාවක් පත් කිරීමටත් යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා :-**

එම යෝජනාව ස්ථිර කරමි.මෙම කමිටුව සඳහා **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.මහේෂ් නිරෝෂණ නාපාවල මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඩී.මහින්ද මහා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලීන් අධිකාරම් මහතා, විශ්‍රාමලත් මහජන සෞඛ්‍ය පරීක්ෂක සරත් හේමචන්ද්‍ර මහතා, ව පත්කරගමු.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ.දයාවතීමිය-**

**මෙම කමිටුව සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා,රොෂාන් මධුශංක මහතාව යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>**

මෙම කමිටුවට නයනා අතුකෝරළ මන්ත්‍රීතුමියව ද පත්කරමු.මට තනතුරු එපා. නමුත් මෙම කමිටුවට නයනා මන්ත්‍රීතුමියව ඇතුලත් කිරීම වටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා-</u>**

මෙම කමිටුවට කේ.කේ.දයාකස්තුරි මන්ත්‍රීතුමියවත් පත්කරමු. ඇය එම කමිටුවට සුදුසුයි.පරිසර අංශයේ කටයුතු තුලින් සම්මාන ලබා තියෙනවා.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

කමිටුව සඳහා ප්‍රමාණවත් පිරිසක් පත්කරමු.

කමිටුවට සාමාජිකයින් පත්කිරීම සංශෝධනය සම්බන්ධව තව දුරටත් දීර්ඝ සාකච්ජාවක් පැවතිණි.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

මෙම කමිටුවට සභාවේ සභාපතිවරයා,ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.මහේෂ් නිරෝෂණ නාපාවල මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඩී.මහින්ද මහා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා, විශ්‍රාමලත් මහජන සෞඛ්‍ය පරීක්ෂක සරත් හේමචන්ද්‍ර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ.දයා කස්තුරි මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා ,සභාවේ ලේකම්වරයා ව පත්කරගමු. මෙම කමිටුව අවශ්‍යතාවය පරිදි හා කලින් දැනුම් දීමක් සිදුකර රැස්වෙමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු කුරුවිට ප්‍රාදේශිය සභා පරිසර හා පහසුකම් කමිටුව නමින් කමිටුවක් විය යුතුය යන්නත් ප්‍රාදේශීය සභාවට අදාළ බල ප්‍රදේශයේ මහජන **සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා හා ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳව මහා සභාවට නිර්දේශ ලබාදීම හා ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් මහා සභාව විසින් කලින් කලට පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම මෙම කාරක සභාවේ කාර්ය විය යුතුය යන්නත් එම කාරක සභාවට** සභාවේ සභාපතිවරයා,ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.මහේෂ් නිරෝෂණ නාපාවල මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඩී.මහින්ද මහා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලීන් අධිකාරම් මහතා, විශ්‍රාමලත් මහජන සෞඛ්‍ය පරීක්ෂක සරත් ප්‍රේමචන්ද්‍ර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ.දයා කස්තුරි මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා සහ සභාවේ ලේකම්වරයා ව ද ඇතුලත් ව කමිටුව පිහිටුවා ගැනීමටත් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

**5. උපදේශන කමිටුව-** කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විශේෂ කරුණු **සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා උපදේශක කමිටුවක් පත් කරගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය-

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා

**මෙම කමිටුව සඳහා බාහිර පාර්ශවයන්ද සහිතව පත්කරමු.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-

**මෙම සාමාජිකයින් අපේ බලප්‍රෙද්ශය නියෝජනය වන අයුරින් පත්කරගමු. කුරුවිට,කිරිඇල්ල කොට්ඨාශ දෙකම. එක් ප්‍රදේශයකින් පමනක් එපා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය-

උපදේශන කමිටුව සඳහා විශ්‍රාමලත් මහජන සෞඛ්‍ය පරික්ෂක සරත් හේමචන්ද්‍ර මහතා, ඉංජිනේරු අජිත් පනාගොඩ මහතා,ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජේෂ්ඨ කථිකාචාර්ය තිලකවංශ චන්ද්‍රතිලක මහතා,සබරගමුව විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය සමන් පෙරමුනේ මහතා,විශ්‍රාලත් පොලිස් පරික්ෂක මනම්පේරි මහතා,ආචාර්ය කමල් අබේවර්ධන මහතා,පත්කරමු.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-

**දන්නා හඳුනන පුද්ගලයින් ඇතුලත්. විශ්‍රාමලත් මහජන සෞඛ්‍ය පරික්ෂක සරත් හේමචන්ද්‍ර මහතා තවත් කමිටුවක ඉන්නවා.තවත් අයෙකුට අවස්ථාව දෙමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ලීලානන්ද මහතා-

**තොරතුරු තාක්ෂණ අංශයද නියෝජනය වන පරිදි පත්කරන්න.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-

**තොරතුරු තාක්ෂණ අංශයද අත්‍යවශ්‍යයි.දක්ෂ ඉංජිනේරු වරයෙක් ඉන්නවා ජයරත්න කියලා.එතුමාව දැනුවත් කරලා ගමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ලීලානන්ද මහතා-

**මෘදුකාංග ඉංජිනේරු තිලින මධුෂංක මහතාවද කමිටුවට ඇතුලත්කරමු.**

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා

ඒ අනුව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විශේෂ කරුණු **සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා උපදේශක කමිටුවක් පත්කිරිමටත් එම කමිටුවට සභාපතිවරයාද ඇතුලත්ව ඉංජිනේරු අජිත් පනාගොඩ මහතා,ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජේෂ්ඨ කථිකාචාර්ය තිලකවංශ චන්ද්‍රතිලක මහතා,සබරගමුව විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය සමන් පෙරමුනේ මහතා,විශ්‍රාලත් පොලිස් පරික්ෂක මනම්පේරි මහතා,ආචාර්ය කමල් අබේවර්ධන මහතා,ඉංජිනේරු ජයරත්න මහතා, මෘදුකාංග ඉංජිනේරු තිලින මධුෂංක මහතා සහ සභාවේ ලේකම්වරයා, ගෙන් සමන්විත කමිටුව පිහිටුවා ගමු. මෙම කමිටුව අවශ්‍යතාවය පරිදි හා කලින් දැනුම් දීමක් සිදුකර රැස්වෙමු.**

සභාවේ මතය විමසීමෙන් අනතුරුව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විශේෂ කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා උපදේශක කමිටුවක් පත්කිරිමටත් එම කමිටුවට සභාපතිවරයාද ඇතුලත්ව ඉංජිනේරු අජිත් පනාගොඩ මහතා,ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජේෂ්ඨ කථිකාචාර්ය තිලකවංශ චන්ද්‍රතිලක මහතා,සබරගමුව විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය සමන් පෙරමුනේ මහතා,විශ්‍රාලත් පොලිස් පරික්ෂක මනම්පේරි මහතා,ආචාර්ය කමල් අබේවර්ධන මහතා,ඉංජිනේරු ජයරත්න මහතා, මෘදුකාංග ඉංජිනේරු තිලින මධුෂංක මහතා සහ සභාවේ ලේකම්වරයා වද ඇතුලත්ව කමිටුව පිහිටුවා ගැනීමටත් ඒකමතිකව මහාසභා සම්මත විය.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

6. 2025 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවට අවශ්‍ය වැඩ ,භාණ්ඩ හා සේවා සම්පාදනය කිරීමේදී සැපයුම් ක්‍රමවේදය තීරණය කිරීම, මිළ ගනන් විවෘත කිරිම, ලැබී ඇති මිල ගනන් යටතේ හා අවශ්‍ය අවස්ථා වලදි තාක්ෂනික ඇගයිම් කමිටු නිර්දේශ අනුව මිලදි ගැනිමට අදාල තීරණයට එළඹීම ප්‍රමාණවත් සාමාජිකයින් සංඛ්‍යාවකින් සමන්විත ප්‍රසම්පාදන කමිටුවක් පත් කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ලීලානන්ද මහතා-</u>

එම යෝජනාව ස්ථිර කරමි. අංක 06-02-1 යටතේ පත් කරගත් මුදල් හා ප්‍රතිපත්ති කමිටු වම අවශ්‍යතාවය පරිදි මෙම සභාවේ ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියාත්මක විම සුදුසුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>
එය සුදුසුයි.අපි මුදල් හා ප්‍රතිපත්ති කමිටු වම අවශ්‍යතාවය පරිදි මෙම සභාවේ ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියාත්මක කරමු.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

2025 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවට අවශ්‍ය වැඩ ,භාණ්ඩ හා සේවා සම්පාදනය කිරීමේදී සැපයුම් ක්‍රමවේදය තීරණය කිරීම, මිළ ගනන් විවෘත කිරිම, ලැබී ඇති මිල ගනන් යටතේ හා අවශ්‍ය අවස්ථා වලදි තාක්ෂනික ඇගයිම් කමිටු නිර්දේශ අනුව මිලදි ගැනිමට අදාල තීරණයට එළඹීම සඳහා මෙම සභාවේ 2025 වසර මුදල් හා ප්‍රතිපත්ති කමිටුව ලෙස පත්වූ සභාපතිවරයා ඇතුලත්ව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා,_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ලීලානන්ද මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ධර්මදාස මහතා සහ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ වරලත් ගණකාධිකාරි ප්‍රදීප් හුලංගමුව මහතා ඇතුළුව සභා ලේකම් වරයා , කාර්මික නිලධාරී ටී.ආර්.රන්ජන් කීර්ති මහතා ඇතුලත් කමිටුව ම පත් කරමු.ඒ අනුව මහා සභා මතය විමසීමෙන් පසු 2025 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවට අවශ්‍ය වැඩ ,භාණ්ඩ හා සේවා සම්පාදනය කිරීමේදී සැපයුම් ක්‍රමවේදය තීරණය කිරීම, ගනන් විවෘත කිරිම, ලැබී ඇති මිල ගනන් යටතේ හා අවශ්‍ය අවස්ථා වලදි තාක්ෂනික ඇගයිම් කමිටු නිර්දේශ අනුව මිලදි ගැනිමට අදාල තීරණයට එළඹීම සඳහා මෙම සභාවේ 2025 වසර මුදල් හා ප්‍රතිපත්ති කමිටුව ලෙස පත්වූ සභාපතිවරයා ඇතුලත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා,_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ලීලානන්ද මහතා ගරු

**ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා,** ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී** කැළුම් ධර්මදාස මහතා සහ **විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ වරලත් ගණකාධිකාරී ප්‍රදීප් හුලංගමුව මහතා ඇතුළුව සභා ලේකම් වරයා ද කාර්මික නිලධාරී ටී.ආර්.රන්ජන් කීර්ති මහතා සමන්විත මුදල් කමිටුවම කටයුතු කිරීමට පත්කිරීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

**7.** කුරුවිට ප්‍රාදේශිය සභාව මගින් අධීක්ෂණය වනු ලබන කුඩා නගර ජල ව්‍යාපෘතිය සඳහා **2025 වර්ෂය සඳහා** පාලක කමිටුවක් පත් කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>**
එම යෝජනාව ස්පීර කරමි.මෙම කමිටුව සඳහා පිරිස පත්කර ගමු. ගරු සභාපතිතුමා,දැනටත්මෙම ව්‍යාපෘතියේ ජල පාරිභෝගික **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** කපිල අබේසිරි මුණසිංහ මහතා, **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.ගයාන් වික්‍රමසූරිය මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර සේනාරත්න මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා, පත්කරගමු.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා-</u>**

මෙම කමිටුවට උපසභාපතිතුමා නම්කල නම් අතරට අළුත් සාමාජිකයිනුත් දමන්න. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** ජේ.කේ.ඩී.ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා, ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්.උමේෂා මල්කාන්ති මිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න මයාත් පත්කරමු.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>**
**අළුත් නම් ඇතුලත් කරලයි නම් කලේ. සිරිල් මන්ත්‍රීතුමා දුර සිට සහභාගිවීම කල හැකිද?**

මෙම කමිටුවට පත්කිරිම් සිදුකිරිම සංශෝධනය සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා සිදුකෙරුනි.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

කුරුවිට ප්‍රාදේශිය සභාව මගින් අධීක්ෂණය වනු ලබන කුඩා නගර ජල ව්‍යාපෘතිය සඳහා **2025 වර්ෂය සඳහා** පාලක කමිටුව ලෙස සභාපතිවරයාවද ඇතුලත්ව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** කපිල අබේසිරි මුණසිංහ මහතා, **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.ගයාන් වික්‍රමසූරිය මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර සේනාරත්න මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** ජේ.කේ.ඩී.ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා, ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්.උමේෂා මල්කාන්ති මිය සහ සභාවේ ලේකම් වරයා , ජල ව්‍යාපෘතියේ පරිපාලක නිලධාරි,කමිටුවේ සංයුතියට අදාල සභාවේ ප්‍රධාන කළමණාකරණ සහකාර, කාර්මික නිලධාරි ( ටී.ආර්.රංජන් කිර්ති මයා) සහ විෂය නිලධාරි ඇතුලත්ව කමිටුව පිහිටුවමු.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-

කුඩා නගර ජල ව්‍යාපෘතිය ආරම්භ කිරීමට හිටපු ගරු උප සභාපති සිරිපාල වීරසේකර මහතාත් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාලන්ද එල්ලාවල මැතිතුමාත් මුල් උනා. මේ ව්‍යාපෘතියේ ජල කමිටුව ගැන විවේචන තියෙනවා.සභාව විසුරුවාට පසුත් තිබුණ කමිටුවක්.පසුගිය කාල සීමාවේ මේ ව්‍යාපෘතියේ ගිණුමේ ඇති මුදල් නීතිරීති කඩ කරලා පරිබාහිරව වැයකර ඇති බවට විවේචන තියෙනවා.සමහර නිලධාරින් ප්‍රසාද දීමනා අරන්.නිලධාරින්ට බෝනස් බෑ. වැටුප විතරයි හිමිවන්නේ.මහජන සුබසෙතට තිබියයුතු ආයතනයක් ජාවාරමක් වෙලා.ජලය දීලා බොහෝ අයට. මේ ව්‍යාපෘතිය ජනතා වට යහපත් ආකාරයෙන් සකසන්න.අපේ ගමේ හොඳ පානීය ප්‍රජා ජල යෝජනා ක්‍රමයක් තියෙනවා. හොඳ ගුණාංග සහිතව ඒක සාර්ථකව ක්‍රියාත්මක වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා.

මේ ව්‍යාපෘතිය ලෝක බැංකු ආධාර මත පවත්වාගෙන ගිය එකක්.සභාවේ පාලනයට ගන්නා කාලයේ වන විට අසාර්ථක වෙලා.කලින් මමත්, හිටපු **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතාත් මේ කමිටුවේ හිටියා.කුරුවිට නගරයට වතුර නැති නිසා පළාත් පාලන අමාත්‍යාංශයේ උපදෙස් මත මාස 06 ක කාලයකට සභාවේ පාලනයට ගත්තේ.මාස 06 න් නැවත දිය යුතුයි.මේ ව්‍යාපෘතිය දැන් අවුරුදු 15 ක් විතර තවම සභා පාලනය යටතේ.ජාතික ජල සම්පාදන මණ්ඩලය යටතට ගන්නවා කියලා තිබුනත් තවම එය සිදුවී නැහැ. නිශ්චිත ක්‍රමවේදයක් යටතේ නොවෙයි මේ ව්‍යාපෘතියේ විධායක කමිටුවට හදිසි තත්ව යටතේ තීරණ ගන්න බලය තියෙනවා.පොදුවේ තියෙන නිශ්චිත ක්‍රමවේදයක් නෑ. ඒනිසා නිශ්චිත නීති රාමුවක් හදන්න. අවුරුදු 20 ක් පැරණි නල තාම තියෙන්නේ.ඩී පයිප්ප.ඒ කාලේ භාවිතා කලේ ඒවා.ඒ බටවල දැන් මලකඩ බැඳිලා.සෝදන්න බෑ.බොන්න බෑ.ජල සම්පාදනයට පවරලා යථාවත් කිරීම තමා සුදුසු.විසල් ජලය සඳහා මලව දක්වා මේවනවිට ජල නල දමලා තියෙනවා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා.

මංගල ඩයස් මන්ත්‍රීතුමා කීවා ජල කමිටුවට නීතිරීති නෑ කියලා.ඒක එක් අයට ඕනි ආකාරයෙන් කමිටුවට කටයුතු කරන්න බෑ.මේ සභාව විසුරුවීමෙන් පසු හා ගිය වසරේ වාර්තාත් දෙන්න.අයිතිකාරයෙක් නෑ කියලා දෙයක් නෑ.ජනතාව එකතුවෙලා හදපු ව්‍යාපෘතියක්.ලොකු මුදලක් බදිනවා ජලය ලබාගන්න මිනිස්සු.ජල සම්පත් මණ්ඩලය සමග සාකච්චා කලා.නීත්‍යානුකූලව පවරන්න හැදුවා.නමුත් භාරගත්තේ නෑ.වසර 20 ක් වැඩ කල සේවකයින් ඉන්නවා මේ ව්‍යාපෘතියේ.සාධාරණයක් විය යුතුයි ඒ අයට.අයවැය වාර්තා දෙන්න.විවිධ චෝදනා තියෙනවා.මුදල් අයථා පරිහරණය වෙලා කියලා.ඒ නිසා මේ පිළිබඳ නිවැරදි වාර්තා ගෙන කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා.

මේ කමිටුවේ මමත් හිටියා.සභාව තිබුන කාලේ.දැන් මේ ව්‍යාපෘතියේ හොයන්න දේවල් තියෙනවා.අයවැය වාර්තා සභාවට ඕනි.ලක්ෂ 55 ක් අත්පිට මුදලට ඉන්දියාවෙන් ගත් මෝටරය ආවාද?කොරෝනා කාලේ නැවට දැම්මත් මෝටරය ප්‍රමාදයි කිව්වා. ලේක් සයිඩ් ව්‍යාපෘතියට ගෙනා බට 100 විතර අස්ථාන ගත වෙලා.හොරුන් අල්ලන්න වෙලාව හරි.මේ කමිටුවේ රු.2000.00ක දීමනාවක් දුන්නා.සහභාගිත්වය දුන් දිනයට.මග වියදම් විධිහට.ඒක වැරදි නම් ඒ මුදල මමආපසු දෙනවා. ඒක බෝනස් නෙමේ.දීමනාවක් කමිටුවට.

මේ වතුර දෙන්න ලොකු මුදලක් අයකරනවා.ඒත් ටැප් දාලත් වතුර නෑ.සභාවේ අවසර නැතුව වතුර දෙනවා.කුරුවිට නගරයට වතුර නැතිව ගිය අවස්ථාවල විශාල ගැටළුවලට මුහුන දුන්නා.රු 12 ටත් මෝටර් දාගෙන විශාල පරිශ්‍රමයක් දැරුවා. වතුර දෙන්න පාරවල් කපලා.විසල් ප්‍රතිපාදන ලැබිලත් පාරවල් හදලා නෑ.කොන්ක්‍රිට් එකම කපලා.දැන් ආණ්ඩුවක් තියෙනවා. සභාවේ බලය තියෙනවා. මේවා හොයන්න පුළුවන්.ලබන සභාවට මෙ වාර්තා දාන්න. මෝටරයක් වතාවක් ගෙනාවා.භාවිතා කල එකක්.ආපහු යැව්වා.ආපසු ගෙනා එක සවිකලාම කඩන් වැටුනා.අයවැය සහිතව විස්තර ,කමිටු දීමනා, ප්‍රසාද දීමනා ආදි විස්තර අවශ්‍යයි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි නයනා ජීවනී අතුකෝරළ මිය-**</u>

මේ ජලයෝජනා ක්‍රමය යටතේ අයවියයුතු බිල් රුසක් තියෙනවා.විශාල ආදායමක්.කෝටි 1 කට වැඩිය අයවියයුතු බිල්.ඒ උනත් ඒ ජලය විසන්ධිකරලා නැහැ. පත්වන කමිටුව මේ සම්බන්ධව සොයාබලා කටයුතු කරන්න..

ජල කමිටුවේ ගිණුම එතනින් අයින් කරලා ප්‍රාදේශීය සභාවේ ගිණුමට ඒකාබද්ධ කරලා එක් ගිණුමක් වන ලෙස පවත්වාගෙන යාම සුදුසුයි.මේවනක විට විසල් ජල යෝජනා ක්‍රමයත් එක්ක සභාවේ ජල සම්බන්දතා ප්‍රමාණාත්මකව ඉවත්කලා.දැන් මේවන විට කුඩානගර ජල යෝජනා ක්‍රමයේ ජල නල පැරණියි.මලකඩ කාලාලු.පිරිසිදු නෑ.ජනතා අප්‍රසාදයක් පවතින්නේ.ඇඳුමක්වත් හෝදන්න බෑ.මේ තත්වය අනුව ඒ ජලය භාවිතයට නුසුදුසුයි.ඉතින් තව දුරටත් ජල කමිටු සම්බන්ධව අවශ්‍යද?ඒ ව්‍යාපෘතියේ ඉන්න සේවක පිරිසට සාධාරණයක් කරලා ඒ අරමුදලත් සභා මුදලට එක් කිරීම සුදුසුයි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා-**</u>

දේවින්ද මන්ත්‍රීතුමා මෝටරයක් ගැන කිව්වා.ඒ සම්බන්ධ වාර්තා ඇති.පරණ මෝටරය කඩාවැටුන නිසා ලංකා ටෙක් එකෙන් අළුත් මෝටරයක් ගත්තා.නිලධාරින් මේ සම්බන්ධව මැදිහත් උනා. මේ සම්බන්ධව වාර්තා ඇති.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා-**</u>

සභාව පැවතුන කාලයේ මමත් හිටියා කමිටුවේ.විශාල මුදලක් වැයකලා ජල මෝටරයට.ඒකාලේ පුවක් අත්ත ජල යෝජනා ක්‍රමය බෝපත් ඇල්ල උඩහින් හදන්න කටයුතු සැලසුම්කලත් විසල් රත්නපුර විරුද්ධ උනා.මෝටරය සම්බන්ධව මොකද උනේ?.අහිංසක ජනතාවගේ මුදල්.මේ ජල ක්‍රමය යටතේ වතුර දුන්නත් මාස 2,3 වතුර නෑ.ජනතාවට විශාල ගැටළුවක්.ඒත් විසල් ජලය දෙනවා කියපු නිසයි පුවක් අත්ත ජල යෝජනා ක්‍රමය නතර උනේ. කෙසේ වෙතත් මේ සම්බන්ධ තොරතුරු හොයන්න. ඕනෑම නිලධාරියෙක්,මන්ත්‍රීවරයෙක් කමක් නෑ. වැරැද්දක් තියෙනවා නම් හොයන්න.ඒ හිටපු නිලධාරීන් ගෙන් අහන්න. පරීක්ෂණයක් කරන්න. අකටයුතු සිදුවෙලාතියෙනවානම් නිසි පියවර ගන්න.කැළුම් හිටියා මේ කමිටුවේ. මට අවශ්‍යයි මගේ නිර්දෝෂී බව.ඉතා දැඩි කැපවීම් කරලා අපි මහ රෑ වැඩ කරලා ජලය ලබා දීමට මිනිස්සුන්ට. මේ කමිටුවේ හිටපු පිරිස වැරදි කලා කියනවා නෙමෙයි.නමුත් මේ කටයුතු සොයාබලන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා.</u>

ගෙනාපු පරණ මෝටරය ආපසු ගෙනිහිල්ලා නැවත මෝටරයක් ගේනකම් එකක් ගත්තා බද්දට.ලක්ෂ 55 ක් දීලා මෝටරය මිලදී අරන් ආයේත් වෙනම එකක් ගේනවා කුලියට.මේවා මහජන මුදල්. අයථා මුදල් පරිහරණ.

මෙම ජල කමිටුව සම්බන්ධව තව දුරටත් දීර්ඝ වශයෙන් සාකච්ඡාව සිදුවිය.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු කුරුවිට ප්‍රාදේශිය සභාව මගින් අධීක්ෂණය වනු ලබන කුඩා නගර ජල ව්‍යාපෘතිය සඳහා **2025 වර්ෂය සඳහා** පාලක කමිටුව ලෙස සභාපතිවරයාවද ඇතුලත්ව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** කපිල අබේසිරි මුණසිංහ මහතා, **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.ගයාන් වික්‍රමසූරිය මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර සේනාරත්න මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** ජේ.කේ.ඩී.ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා, ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්.උමේෂා මල්කාන්ති මිය ,සභාවේ ලේකම් වරයා සහ කමිටුවේ සංයුතියට අදාල සභාවේ ප්‍රධාන කළමණාකරණ සහකාර, ජල ව්‍යාපෘතියේ පරිපාලක නිලධාරි ,කාර්මික නිලධාරි ( ටී.ආර්.රංජන් කීර්ති මයා ) සහ විෂය නිලධාරි ඇතුලත්ව කමිටුව පිහිටුවීමට ඒකමතිකව මහා සභා තීරනය විය.**

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

**8. 2025 වර්ෂය සඳහා** කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල සඳහා, මහජන පුස්තකාල විධිමත් කිරිම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යස්ථාව අනුව පුස්තකාල උපදේශන කමිටුව පත්කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>
එම යෝජනාව ස්ථිර කරමි.කමිටුවට ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් .චන්ද්‍රකුමාර් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න මහතා ව පත්කරමු.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ටී.අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා-</u>

පුස්තකාල කමිටුව සඳහා ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සුධීරා සේමිණී ලියනගේ මිය, ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලාශාන්ති මිය,බාහිර පාර්ශවය නියෝජනය කරමින් සබරගමු විශ්ව විද්‍යාලයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය සමන් පෙරමුණ මහතා,ව පත්කරමු.**

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

මෙම කමිටුවේ සංයුතියට අදාලව සභාවේ සභාපතිවරයා,සභාවේ සභිකයින් තිදෙනෙක්, ආගම් නියෝජිතයින් ,සභාබලප්‍රෙද්ශයේ පදිංචි විශිෂ්ඨයින් තිදෙනෙක් සභාවේ ලේකම්,ප්‍රජාසම්බන්ධතා නිලධාරී, ප්‍රධාන පුස්තකාලයාධිපති,බල ප්‍රදේශයේ විදුහල්පතිවරයෙක්,ප්‍රබල ප්‍රදේශයේ ප්‍රජාමණ්ඩල නියෝජිතයෙක් වශයෙන් අතුරු ව්‍යවස්ථාවේ පවතින අතර ඊට සමගාමීව මේ පිරිස පත්කර ගමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-</u>**

ආශා සමන්කුමාරි මන්ත්‍රීතුමියවත් පත්කරමු.ප්‍රජා මණ්ඩල කටයුතුත් කරනවානේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>**
අනුර කුරුප්පු මහතාවත් පත්කරමු. අහන්න වෙනවා සහභාගී වෙන්න වෙලාව තියෙනවාද කියලා.

කමිටුවට පත්කිරිම් සංශෝදන පිළිබඳව සාකච්ජාව දීර්ඝ ලෙස පැවතුණි.ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසුව **2025 වර්ෂය සඳහා** කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල සඳහා, මහජන පුස්තකාල විධිමත් කිරිම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව පුස්තකාල උපදේශන කමිටුව සඳහා ගරු සභාපතිතුමා, ආගමික නියෝජිතයින් ලෙස මේවන විටද කමිටුවේ කටයුතු කරන පූජ්‍ය හේනේපොල සුමනජෝති හිමි,කීරගල කෝවිලේ කුරුක්කල් තුමා,කුරුවිට පල්ලියේ පූජකතුමන් ඇතුළුව කමිටුවට **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් .චන්ද්‍රකුමාර් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සුධීරා සේමිණි ලියනගේ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලාශාන්ති මිය ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී** ආශා සමන්කුමාරි මන්ත්‍රීතුමියවත් **බාහිර පාර්ශවය නියෝජනය කරමින් සබරගමු විශ්ව විද්‍යාලයේ ජේෂ්ඨ කථිකාචාර්ය සමන් පෙරමුණ මහතා,** කුරුවිට සභිරා විද්‍යාලයේ විදුහල්පති තුමා,සභාවේ ලේකම්වරයා,සභාවේ ප්‍රජා සම්බන්ධතා නිලධාරි ,ප්‍රධාන පුස්තකාලයාධිපති,ඇතුලත්ව පිහිටුවිමටත් ඒකමතිකව තීරණය විය.

**06-3. ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -1987 අංක 15 දරණ** ප්‍රාදේශිය සභා පනතේ 19 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 132 වගන්තිය යටතේ කුරුවිට ප්‍රාදේශිය සභාව වෙත පැවරී ඇති බලතල අතුරින් එම පනතේ 12 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධානයන්ට අනුව මෙම ප්‍රාදේශිය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත මුදල් සීමා ව සම්බන්ධව බලය පවරාදීමට මුල්‍ය සීමාවක් පනවාගැනීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා-</u>**

එම යෝජනාව ස්ථිර කරමි. සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත රු.1000000.00ක මුදල් සීමාවක බලය පවරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ලීලානන්ද මහතා-</u>**

**සභාවේ මුදල් කමිටුවට ලක්ෂ 15 ක සිමාවක් ලබාදෙමු.මේ බල ප්‍රදේශය විශාලත්වය වැඩිම.ඉටුකලයුතු සේවය අති විශාලයි.කම්ටුවට මේ සීමාව ලබාදෙමු.**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>**

මම තවත් සභා වලින් විමසීම් කලා. ඒවා සියල්ල ලක්ෂ 10 හෝ ඊට ඉක්මවා ගිය මුදල් බලයක් කමිටුවට දීලා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-</u>**

**මුදල් කමිටුවට වැඩි වගකීමක් එනවා.අපි ලක්ෂ 3-5 අතර සීමාවකට යමුද?**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ජයලාල් මහතා-**

කමිටුව වගකීම දරලා කටයුතු කල යුතුයි.ලක්ෂ 15 කට යමු.

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-**

මුදල් කමිටුව වගකීම දැරිය යුතුයි. පනතේ නැති දේවලට වියදම් කරන්නේ නැහැ.පනතේ ප්‍රකාරව දක්වා ඇති දේවලට,ගංවතුරට ජනතාවට මුදල් දෙන්න සභාවවට බෑ.ඒත් ගංවතුරට කඩාගෙන ගිය පාර හදාගන්න හදිසියේ බෝක්කුව ගැලවිල ගියොත් ඒක හදන්න ඒවා පුළුවන්.ලක්ෂ 3ට ගියොත් ඒවාට මදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-**

ප්‍රශ්නය තියෙන්නේ සාමාන්‍ය දේවලුත් හදිසි වෙනවානේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා-**

පෙර ලක්ෂ 3 න් කමිටු කටයුතු සිදු උනා.දැන් ඉල්ලීම ලක්ෂ 10,15.නමුත් මේක හදිසියක් උනොත් පමනයි යොදාගත යුත්තේ.හදිසි හා සාමාන්‍ය යන්න තේරෙනවානේ.

මෙම මුදල් සීමාව පනවා ගැනීම සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ජාව පැවතුණි.

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා**

පසුව **1987 අංක 15 දරණ** ප්‍රාදේශිය සභා පනතේ 19 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 132 වගන්තිය යටතේ කුරුවිට ප්‍රාදේශිය සභාව වෙත පැවරී ඇති බලතල අතුරින් එම පනතේ 12 වන වගන්තිය යටතේ සදහන් විධිවිධානයන්ට අනුව මෙම ප්‍රාදේශිය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත මුදල් සීමා ව ලෙස රු.1000000.00 ක (ලක්ෂ 10 ක) ප්‍රාග්ධන හෝ පුනරාවර්තන මුල්‍ය සීමාවක බලය පවරාදෙමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසුව **1987 අංක 15 දරණ** ප්‍රාදේශිය සභා පනතේ 19 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 132 වගන්තිය යටතේ කුරුවිට ප්‍රාදේශිය සභාව වෙත පැවරී ඇති බලතල අතුරින් එම පනතේ 12 වන වගන්තිය යටතේ සදහන් විධිවිධානයන්ට අනුව මෙම ප්‍රාදේශිය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත මුදල් සීමා ව ලෙස රු.1000000.00 ක (ලක්ෂ 10 ක) ප්‍රාග්ධන හෝ පුනරාවර්තන මුල්‍ය සීමාවක බලය පවරාදීමට ඒකමතිකව මහා සභා තීරණය විය.

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා-**

**06-4. 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 19 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 132 වගන්තිය හෝ වෙනත් යම් ලිඛිත නිතියක් යටතේ කුරුවිට ප්‍රාදේශිය සභාවේ අරමුදලින් කල හැකි පුනරාවර්තන හෝ ප්‍රාග්ධන වියදමක් දැරීම සඳහා රු.20000.00 ක මුදල් සීමාවක් සහිත බලය දීමටත් සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවේ සභාපතිවරයාගේ පොදු පරිපාලනයට යටත්ව 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 215 වගන්තිය යටතේ ප්‍රාදේශිය සභාවේ ලේකම් වෙත අධිකාරිය පැවරිය යුතු බවටත් තවද එම අධිකාරිය මෙම යෝජනාවට අදාල**

**සභාවේ සම්මුතිය මෙම ප්‍රාදේශිය සභාව විසින් පරිච්චින්න කරන තාක්කල් වලංගු විය යුතු බවටත් යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

**එම සීමාව සුදුසුයි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසුව **1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 19 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 132 වගන්තිය හෝ වෙනත් යම් ලිඛිත නිතියක් යටතේ කුරුවිට ප්‍රාදේශිය සභාවේ අරමුදලින් කල හැකි පුනරාවර්තන හෝ ප්‍රාග්ධන වියදමක් දැරීම සඳහා රු.20000.00 ක (රුපියල් විසිදාහක) මුදල් සීමාවක් සහිත බලය දීමටත් ඒ සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවේ සභාපතිවරයාගේ පොදු පරිපාලනයට යටත්ව 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 215 වගන්තිය යටතේ ප්‍රාදේශිය සභාවේ ලේකම් වෙත අධිකාරිය පැවරිය යුතු බවටත් තවද එම අධිකාරිය මෙම යෝජනාවට අදාල සභාවේ සම්මුතිය මෙම ප්‍රාදේශිය සභාව විසින් පරිච්චින්න කරන තාක්කල් වලංගු විය යුතු බවටත් මහා සභා ඒකමතිකව තීරණය විය.**

**06-5.** ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා - 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ **8(1)වගන්තිය ප්‍රකාරව කුරුවිට ප්‍රාදේශිය සභාවේ සභාපතිවරයා වෙත පැවරි ඇති විධායක ක්‍රියා ඉටු කිරීම සම්බන්ධයෙන් අංක PF 7449 දරන නිලරථයේ ධාවන කටයුතු සඳහා මාසිකව ඩීසල් ඉන්ධන ලීටර් 800 ක් යොදාගැනීමට අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා-</u>

**මේ සම්බන්ධව සොයාබැළුවාද? වෙනත් සභාවල ඉන්ධන සීමා පිලිබඳව? රත්නපුර සභාවේ සිමාව 500 යි.ඒකත් වැඩියි කියලා කෑගහලා.ලීටර් 500 වත් විරුද්ධ වෙලා.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා-</u>

**වර්ග කිලෝ මිටර් 268ක්.ප්‍රමාණය විශාලම බල ප්‍රදේශය කුරුවිටට හිමියි. රත්නපුරට වඩා වපසරියක් සේවාවන් සපයන්න තියෙනවා.වැඩි වෙහෙසක් දරන්න තියෙනවා.ලීටර් 800 ගත්තත් දුවන ප්‍රමාණය අනුවයි ඒ ඉන්ධන වැයවෙන්නේ. ඒ නිසා අනුමැතිය දුන්නට ගැටළුවක් නෑ.800 තමා ගියවරත් තිබුණේ. එකඟයි.**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

**අනෙකුත් සභා වලින් අහලා මේ සභාවට සීමා පනවන්න අවශ්‍ය නෑ.ඒ වගේම මේ ඉන්ධන පිලිබඳ කටයුතු නිකම් වෙන්නේ නෑ. රනිං චාට්,වාර්තා ආදිය පදනම් වෙනවා.උපරිමය ලිටර් 800 සුදුසුයි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-

**ලිටර් 800 දවස් 30 දිව්වත් දවසට ලිටර් 26.යි.එතකොට කි.මී.226 ක් යන්න ඕනි. රාජකාරි බහුල වෙයි.මන්ත්‍රිවර්න්ට හම්බුවෙන්නේ ලිටර් 16,17යි.රීති පොතෙත් එහෙමයි.ඔබතුමාගේ තෙල් වලින් හරි උදව් කරන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසුව - 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ **8(1)වගන්තිය ප්‍රකාරව කුරුවිට ප්‍රාදේශිය සභාවේ සභාපතිවරයා වෙත පැවරි ඇති විධායක ක්‍රියා ඉටු කිරීම සම්බන්ධයෙන් අංක PF 7449 දරන නිලරථයේ ධාවන කටයුතු සදහා මාසිකව ඩීසල් ඉන්ධන ලීටර් 800 ක් යොදාගැනීමට අනුමැතිය ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසුරිය මහතා

06-6. 2025.05.30 දින ප්‍රකාශයට පත්කරන ලද ප්‍රාදේශීය සභා රීති 43(1) වගන්තිය හා ඒ සමග කියවිය යුතු 43(2) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශිය සභා රැස්වීම් වලට සහභාගීවීම වෙනුවෙන් සභාපති,උප සභාපති හා සභික වරුන්ට ගෙවිය යුතු මාසික යැපීම් දීමනා වල එකතුව රු.8000.00ක උපරිමයට යටත්ව ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-

එම යෝජනාව ස්ථිර කරමි. මෙය උපරිමය වේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-

නිලධාරින් සභාව යටත් ආයතනයක් ලෙස ගෙනියනවා.අපි ඒ අයගේ යටත් සේවකයෝ වගේ. මේ සභාවේ නිලධාරි නෙමේ.රීති හදන අය.රීති වෙනස්කරලා.ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලන්න.වෙනස්කරන්න මේ දෙන විධිහ.කව්රුවත් මේ දීමනාව ගන්න නෙමේ එන්නේ. නමුත් පාර්ලිමේන්තුවට විශාල මුදලක් වැය වෙනවා.ගමේ මරණෙට මගුලට සේරටම යන්න ඕනි අපි.ගෞරවයක් ලැබෙන විධිහට මේ දීමනා දෙන්න.දැන් තියෙන විධිහට බිල් ඕනි හැම එකකකටම.ඉල්ලීමක් කරන්න. මේ සම්බන්ධව ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීම කරන්න.මේ 8000.00 දීමනාව යම් ක්‍රමවේදයක් අනුව දීමනාවට එකතු කරන්න. අපිට ඉන්ධන වගේම දුරකථන බිලත් යනවා.මහජන සේවය සැලසීමේදී විවිධ ආයතන, විවිධ සංවර්ධන කටයුතු සඳහා නිතර ඒ ස්ථාන වලට යන්න වගේම ඇමතුම් ගන්න වෙනවා. ඉල්ලිමක් කරන්න ආන්ඩුකාරතුමියගෙන්. ඒ වගෙම 1991 වර්ෂයේ දි විතර පොඩි ප්‍රමාණයක් සභාවේ හිටියේ මන්ත්‍රිවරු.පසුකාලීනව ඒ ප්‍රමාණ වැඩිඋනා.තත්වය අඩු උනා.දීමනා දෙන විධිහත් දැන් ගැලපෙන්නෑ.මේ ඉල්ලීම කරලා පෙර පරිදි දීමනාව එක්ක දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා-

මේ තත්වය මන්ත්‍රිවරයා ඉතාම අපහසුවට පත්කරන තත්වයක්.හැම එකකකටම බිල් ඉල්ලන්න වෙනවා.බොරු බිල් හදන්න බෑ.මේ ක්‍රමය සුදුසු නෑ.මන්ත්‍රිවරයා හැල්ලුවට පත් වෙන තත්වයක්.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-

මහජන නියෝජිතවරු කියන්නේ මහජනතාව පත් කර එවූ පිරිස.ජනතාවගේ අභිමානයයි අපි ඉටු කරන්නේ.මහජන නියෝජිතයෝ දූෂන වංචා නැති ආදර්ශවත් පිරිසක් විය යුතුයි.ගෞරවය රැකගත යුතුයි.මේ චක්‍ර ලේඛයේ ඇඳුම යුරෝපීයයි.නමුත් මේ මගේ විධිහ.දීමනා ගරු සැලකිල්ලත් රැකෙන පරිදි දෙන්න.රු.8000.00 ගන්න අපිව හැල්ලුවට පත් කරන්න එපා.ලේකම් වරයා ඉදිරියේ පවා අවහාවිත වෙන්න වෙනවා.මේක සොයා බලා සුදුසු ක්‍රමවේදයකට දෙන්න.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා

ප්‍රාදේශිය සභා රැස්වීම් වලට සහභාගීවීම වෙනුවෙන් සභාපති,උප සභාපති හා සභික වරුන්ට ගෙවිය යුතු මාසික යැපීම් දීමනා වල එකතුව රු.8000.00ක උපරිමයට යටත්ව ගෙවීම සුදුසුයි වගේම එම දීමනාව දෙන ක්‍රමවේදය පිලිබඳව ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට ඉල්ලීමක් යවමු.මන්ත්‍රිතුමන්ලාට සංවර්ධන කටයුතු වලදි ඒ ස්ථානවලට යන්න වෙනවා.ගමේ සියළු කටයුතු වලදි ජනතා නියෝජිතයා ලෙස යන්න වෙනවා.ඒ වගේමසියළු කටයුතු වලදි දුරකථනය භාවිතවෙනවා.ඒ නිසා උපරිමය රු.8000.00 වගේම ඉන් රු.5000.00ක් ඉන්ධන දිමනාව ලෙස හා රු.3000.00 ක් දුරකථන දිමනා ලෙස මාසික දිමනාවට එකතු කර ගෙවීම් කිරිම සඳහා සබරගමු පළාත් ගරු ආන්ඩුකාරතුමියගේ අනුමැතියට යවමු.

ඒ අනුව මහා සභා මතය විමසීමෙන් පසු 2025.05.30 දින ප්‍රකාශයට පත්කරන ලද ප්‍රාදේශීය සභා රීති 43(1) වගන්තිය හා ඒ සමග කියවිය යුතු 43(2) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශිය සභා රැස්වීම් වලට සහභාගීවීම වෙනුවෙන් සභාපති,උප සභාපති හා සභික වරුන්ට ගෙවිය යුතු මාසික යැපීම් දීමනා වල එකතුව රු.8000.00ක උපරිමයට යටත්ව ගෙවීමට මහාසභා ඒකමතිකව තීරණය වූ අතර ඉන් රු.5000.00ක් ඉන්ධන දීමනාව ලෙස හා රු.3000.00 ක් දුරකථන දීමනා ලෙස මාසික දීමනාවට එකතු කර ගෙවීම් කිරිම සඳහා සබරගමු පළාත් ගරු ආන්ඩුකාරතුමියගේ අනුමැතියට ඉල්ලීමක් යොමුකිරීමට ඒකමතිකව තීරණය විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා

06-7. කුරුවිට ප්‍රාදේශිය සභාව සතු නාමල්දෙනිය සංචාරක ගිමන්හලේ බදු ගිවිසුම් කාලය 2025.07.24 දිනෙන් අවසන් වන අතර ඉදිරි වසර 03 ක කාලයක් සඳහා ටෙන්ඩර් මත බදු ලබාදීම සඳහා මහ සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ප්‍රේමරත්න මල්කැකුල මහතා-

මේ යෝජනාව සම්බන්ධව ඉල්ලීමක් කරනවා. නාමල්දෙනිය සංචාරක ගිමන්හල පිලිබඳව ගිවිසුමකට එළඹුනා.ආණ්ඩුකාර අනුමැතිය එක්ක.ගිවිසුමකාලය ඉවරඋනා.නමුත් කොරෝනා කාලේ මේ ගිමන්හල වහලා තිබුනේ.ඉදිකිරිම් වලටත් වහලා.ඒ කාලේ මාස කිපයක්ම වහලා.යතුර ග්තතේ 2023 දි නාමල්දෙනිය උප කාර්යාලයෙන්.මේ පිලිබඳව සභාවට වාර්තාවක් සමග ඉදිරිපත්කරන්න.මේ ගිවිසුම ට බැඳුන පුද්ගලයාට සාධාරනයක් ඉටු කරන්න.මේ පිලිබඳව සලකා බලා තීරණයක් ගන්න.ඉල්ලා සිටිනවා.ලබන 21 න් කාලය ඉවරයි.මුදල් කමිටුවට හෝ යොමුකර විස්තර සහිතව සලකා බලා තීරණයක් ගන්න.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා-__

මේ ගිමන්හල පසු ගිය සභාවාරයේදිත් යෝජනා කලා.ඇත්තටම මේගැන සලකා බැලිය යුතුයි.ගිමන්හලට මිනිස්සු එන්නේ නෑ.කෙරෝනා කාලේ පාඩු පිටයි භාරගත්තේ.දිගු කාලයක් වහලා තිබුනා.එවාටත් එක්කයි මුදල් ගෙවන්නේ.ටෙන්ඩර් කලාට බොහෝම අමාරුයි දෙන්න.මේ ගොඩනැගිල්ලත් විවිධ දෝෂ පවතින නිසා අසාර්ථකවීම් වැඩියි කියලා කියන්නේ.අපි අවස්ථාවක් දෙමු.වැටුන කෙනාට ගොඩඑන්න.ටෙන්ඩර් නොකර එතුමාටම දෙනවානම් හොඳයි.

මේ අවස්ථාවේදී නාමල්දෙනිය ගිමන්හල ප්‍රසිද්ධ ටෙන්ඩර්කිරිමට පළාත්පාලන කොමසාරිස් මගින් ගරු ආණ්ඩුකාර අනුමැතිය ගෙන ඇති බවත් නව තක්සේරුව මාසික රු.38000.00 ක් වනඅතර වාර්ෂිකව රු.456000.00 ක් වන බවත් ටෙන්ඩර්කර බදු ලබාදීමට අනුමැතිය ලැබී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් සභාවට කරුණු දක්වන ලදී.එසේම විගණනය අනුව පුවත්පත්දැන්වීම් සිදුකර මෙම ක්‍රියාවලිය ක්‍රමවේදයට නීත්‍යානුකූලව සිදුකරන ලෙස උපදෙස් ලැබී ඇති බවත් කරුණු දක්වන ලදී.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා-__

දේවින්ද මන්ත්‍රිතුමා කියන කථාව හරි.කාලයක් මේ ස්ථානය ජරාජීර්ණ වෙලා තිබුනා.පවත්වාගෙන යන කෙනාගේ වැරදි නෙමේ.මේස්ථානය වාහන නවත්වලා ලයිට් දාගෙන ශබ්ද නගලා සිංදුකියන විනෝද සමයක් කරගෙන.අයිති කෙනා අසරණයි.අවට ජනතාවටත් හිසරදයක්.රැට. මෙතන මහජන පීඩාවක් වෙලා.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රොෂාන් මධුශංක මහතා-__

ගිමන්හල හොඳින් පවත්වාගෙන යනවා.තිබුණාට වඩා හොඳින් කරගෙන යනවා.සෞඛ්‍ය පිලිබඳව සොයන සේවක පිරිසක් ඉන්නවා.දේශපාලනය පාට පක්ෂය බලන්නැතිව දුෂ්කර කාලයක් පසුකරගෙන එතුමා ආවේ.එතුමාටම මේක ක්‍රමවේදයකට දෙනවා නම් හොඳයි.අහිංසක මිනිසුන්ට කීයක් හරි හම්බකරන්න තියෙන අවස්ථාවක්. කොට්ඨාශයේ මන්ත්‍රී, සුධීරා මන්ත්‍රීතුමියත් මේ තත්වය දන්නවා.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-__

මෙතන විගණන විමසුමක්තියෙනවා.කොමසාරිස් නිර්දේශ තියෙනවා.වැරදි ක්‍රම අනුව ගියොත් අධිභාර වලට ලක්වෙන්න පුළුවන්.මෙතන බෙදීමක් ඉල්ලුවේ නැති නිසා යම් අධිභාරයක් ආවොත් හැමෝම ලක් වෙනවා.ඒ නිසා අධිභාර නැතිව වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්න.

__ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-__

**මගේ යෝජනාවකට පළාත් සභා මහ ඇමතිතුමා හදපු ගිමන්හල.පිට්ටනියක් තිබුණ තැනක්.පරමාර්ථය ගිමන්හල.දුරබැහැර ඉඳන් එන මිනිස්සුන්ට අතපය මුණ හෝදාගෙන විවේක අරන් යන්න තියෙන තැනක්.ගිමන්හල.අයකිරිමකින් තොරවයි තිබියයුත්තේ.අඹ විකුනන මනුස්සයෙක් ඉල්ලිමක් කලා.ලොකු මුදලක් වැයකලා.ගිමන්හල තමා අංක 1.ෂොප් දාන්න බෑ.මම එකහයි ටෙන්ඩර්කලාට.අවසානේ විගණනයත් වෙන්න බෑ.පත්තරේ දැම්මොත් විශාල මුදලක් යනවා.ගිමන්හල ගියවර දෙන්න ඇත්තේ සීමිත ටෙන්ඩර් වෙන්න ඇති.කාට දුන්නත්**

**මේක ගිමන් හලක්.මේ සම්බන්ධයෙන් වැඩියම බැණුම් අහන්නේ මම.ගිමන්හල යථාවත් කරන්න.ඉඹුල්පෙයි මෙහෙයි විතරයි ගිමන්හල් තියෙන්නේ.වෙළඳ ස්ථාන තිබුනට කමක් නැ.නමුත් ගිමන්හලත් ඕනි.ඒනිසා ගිමන්හල කියන සිද්ධාන්තය තියාගන්න.ටෙන්ඩර්කරනවා කියලා මාස ගනන් නිකම්තිබුනොත් අපිට අධිභාරවෙයි.වාස්තු දෝෂ නිසාම ගන්න අයත් යනවා.ඕක අවසානේ එහෙම ගැටළුවකට යන්න එපා.නිවැරදි තින්දුවක් ගමු. මුදල් කමිටුවට හෝ යොමුකරලා.**

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

ඉදිරිපත්වූ කරුණු සලකා බලා මෙම ගිමන්හල පිලිබඳ ඉදිරි කටයුතු කිරිම සඳහා ඉදිරි මුදල් කමිටුවේදී සාකච්ඡා කොට යම් නිගමනයකට එමු.

ඒ අනුව කුරුවිට ප්‍රාදේශිය සභාව සතු නාමල්දෙනිය සංචාරක ගිමන්හලේ බදු ගිවිසුම් කාලය 2025.07.24 දිනෙන් අවසන් වන අතර ඉදිරි වසර 03 ක කාලයක් සඳහා ටෙන්ඩර් මත බදු ලබාදීම පිලිබඳව යෝජනාව සඳහා මහාසභා එකඟත්වය නොලැබුණ අතර මේ සම්බන්ධයෙන් ඉදිරි මුදල් කමිටුවට යොමුකර යම් නිගමනයකට එළඹීමට සාකච්ජා විය.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

06-8. කුරුවිට නගරයේ පිහිටි මහ පාලම අසල පොදු වැසිකිළිය ටෙන්ඩර් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා-</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

මෙම වැසිකිලිය ටෙන්ඩර්කිරීම සම්බන්ධව රජයේ වාර්ෂික තක්සේරු වටිනාකම රු.15000.00 ක් වන අතර මාසික බදු මුදල රු.1250.00ක් වේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා-</u>**

මේ කුරුවිට නගරය විවේකයේ නවාතැන ලෙස සංවර්ධනය කිරීම තුල කුරු ගං ඉවුර සංවර්ධනය කලා.ඒ හදපු වැසිකිලි,තොටුපල නඩත්තු නැතිව දැන් දිරාපත් වෙමින් පවතිනවා.ගංඉවුර සංවර්ධනය කිරීම සභාවට වටිනවා.මම ඉල්ලනවා සභාව එකඟත්වය ඇතුව ගං ඉවුර සංවර්ධනය කරන්න.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u>

අනතුරුව කුරුවිට නගරයේ පිහිටි මහ පාලම අසල පොදු වැසිකිළිය ටෙන්ඩර් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබාදීමටත් එය රජයේ වාර්ෂික තක්සේරු වටිනාකම රු.15000.00 ක් හා මාසික බදු මුදල රු.1250.00ක් වන අවමය අනුව ටෙන්ඩර් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව කුරුවිට නගරයේ පිහිටි මහ පාලම අසල පොදු වැසිකිළිය ටෙන්ඩර් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබාදීමටත් එය රජයේ වාර්ෂික තක්සේරු

වටිනාකම රු.15000.00 ක් හා මාසික බදු මුදල රු.1250.00ක් වන අවමය අනුව ටෙන්ඩර් කිරීමටත් ඒකමතිකව සභා තීරණය විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

06-9. කුරුවිට නගරයේ වාණිජ සංකීර්ණය A ගොඩනැගිල්ලේ පිහිටි ලංකා ධීවර සංස්ථා මාළු වෙලඳසැළ ටෙන්ඩර් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-**

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

මෙම මාළු වෙළඳසැල ටෙන්ඩර් කිරීම සම්බන්ධ රජයේ තක්සේරුව ලබාගැනීමට යොමු කර ඇති අතර ආදායම් පරීක්ෂකගේ තාවකාලික තක්සේරු වටිනාකම වාර්ෂික රු.531023.19 ක් වන අතර මාසික බදු මුදල රු.44251.93 ක් වේ.එය අවමය ලෙස ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසු කුරුවිට නගරයේ වාණිජ සංකීර්ණය A ගොඩනැගිල්ලේ පිහිටි ලංකා ධීවර සංස්ථා මාළු වෙලඳසැළ ටෙන්ඩර් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබාදීමටත් එය ආදායම් පරීක්ෂකගේ තාවකාලික තක්සේරු වටිනාකම වාර්ෂික රු.531023.19 හා මාසික බදු මුදල වන රු.44251.93 අවමය අනුව ටෙන්ඩර් කිරීමටත් මහාසභා තීරනය විය.

06-10. ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා

කිරිඇල්ල නව වෙළඳ සංකීර්ණයේ පිහිටි අංක 04,අංක 05,අංක 06, හා අංක 07 දරණ කඩ කාමර ටෙන්ඩර් කිරීම සම්බන්ධව මහ සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා-**

මෙම යෝජනාව සම්බන්ධව කරුණු කීපයක් දැන ගත යුතුයි.මේ කඩ සම්බන්දව ගෙවීමට ඇති මුදල් ගෙවලා.ගිවිසුම්ගත වෙලා.සාකච්ජාවලටත් ආවා.දැන් ඇයි ටෙන්ඩර් කිරීමක්?තව සුරතල් මසුන්,රෙදි ව්‍යාපාර ආදි කඩ තියෙනවා.

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-**

මෙම කිරිඇල්ල නව වෙළඳ සංකීර්ණයේ පිහිටි අංක 04,අංක 05,අංක 06, හා අංක 07 දරණ කඩ කාමර ටෙන්ඩර් කිරීම සම්බන්ධව සාකච්ජා කරගැනීමට මහා සභාව කාරක සභා අවස්ථාවට පත් වීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා-**

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා

මහා සභාව කාරක සභාවක් බවට පත් වෙමු.

**මෙම අවස්ථාවේදී මහා සභාව කාරක සභා අවස්ථාවට පත්වූ අතර ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් කරුණු දක්වමින් මෙම කඩ හිමියා විසින් ටෙන්ඩර් කිරිම් ආදී මූලික ගාස්තු ගෙවිම සිදුකර ඇති බවත් සභාවෙන් ඉල්ලිමක් ලෙස මෙම කඩ කාමරය කඩයක් ලෙස 2 කට වෙන් කර දෙන ලෙස ඉල්ලා ඇති බවත් මූලික ගෙවීම් සිදු කර ඇතත් ඊළග ගෙවීම් සඳහා දැනුම් දිමක් තමන්වෙත සිදුකර නොමැති බවත් යතුර භාරදිමක් හෝ සිදුකර නොමැති බවත් දැනුම් දුන්බව ප්‍රකාශ කලේය.එසේම කඩ ප්‍රතික්ෂේප කර නොමැති අතර කඩ 2ක් වසා වසා ඇති බවත් මෙම කටයුත්ත සඳහා ටෙන්ඩර්කරු එකඟනොවන බවත් දැනුම් දුණි.එසේම ගිවිසුමේ කොන්දේසිවලට එකඟබවත් ලක්ෂ 38 ක් එකවර ගෙවා ඇති කඩ හිමියා ගිවිසුම අත්සන් කර ඇති බැවින් අසාධාරණයක් සිදු නොකරන ලෙසද දැන්වීය.බදුකරු සමග සාකච්ජාකරන ලෙසද දැක්වීය.මස් මාළු කඩවල වැසිකිලි සකසා දිය යුතු බවත් වසා තියෙන ස්ථාන පූර්ව දැනුම් දීම්කර නීත්‍යානුකූල කටයුතු කලයුතු බවටත් ප්‍රකාශ කලේය.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා අදහස් දක්වමින් මෙම කඩ හිමියා මුදලින් ලක්ෂ 38 ක් ගෙවීම් කර ඇති අතර ලක්ෂ 38 ගෙවපු බිල් පත පවා ඔහු සතු බවත් යතුර භාරදී නොමැති බවත් වසා ඇති කඩ සඳහා දඩය ලක්ෂ 3 ක් පමන ඇති බවත් වසා ඇති කඩ බැවින් මේ සම්බන්ධව සලකා බලා කටයුතු කරන ලෙසත් අධිභාර ආදිය නොවන ලෙස නීත්‍යානුකූලව හා සාධාරනව මෙම කටයුත්ත විසඳන ලෙසත් ඉල්ලීය. දඩ මුදලද ගෙවිම් කිරිමට ඔහු එකඟබවත් වැඩි දුරටත් ප්‍රකාශ කලේය.එසේම ගරු කුලරත්න මන්ත්‍රීවරයා අභාවයට පත් විම හේතුවෙන් අයවීමට ඇති නීතිඥ ගාස්තු අධිභාරය එතුමාගෙන් අයකිරීමට ලිපි නොයවන ලෙසත් එම මුදල තමාගෙන් අයකරන ලෙසත් දැනුම්දුණි.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා අදහස් දක්වමින් සාධාරනව මෙම ගැටළුව විසඳන ලෙසත් විගනන ආදී ගැටව ඇති නොවන ලෙස ආණ්ඩුකාරතුමියගේ අනුමැතියක් ගෙන හෝ මෙය සාධාරනව විසදින ලෙස අදහස් දැක්විය.කඩ 4 ටෙන්ඩර්කිරීම අසාධාරන බවත් දැනුම්දුණි. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදිප් මහතා අදහස්දක්වමින් කඩ හිමියාට අයත් කඩකාමර 4 හි මැද බිත්ති දෙක ඉවත් කරදෙන ලෙසඉල්ලීමක් කර ඇති බවත් එක් පැත්තක් කිරිඇල්ල ප්‍රාථමික විද්‍යාලයේ බැම්මට යාව ඇති බවත් කඩ 3ක් එක් කර මැද බිත්ති දෙක ඉවත් කරදෙන ලෙසත් ඉල්ලා ඇති අතර මෙම කඩ ඉඩංගොඩ නගරයේ ඇති හොඳම කඩ වන බවත් දැනුම් දුණි.**මේ අවස්ථාවේ සභාලේකම්වරයා අදහස් දක්වමින් මෙම කඩ වල පෙරගෙවුම් මුදල ගෙවා ඇතත් 2023 සිට වාරික 18ක් කුලී මුදල් ගෙවා නොමැති බවත් මුදල් ගෙවන ලෙස දැනුම්දී ඇතත් මෙතෙක් සිදුකර නොමැති බවත් දැනුම්දුණි.මෙම අවස්ථාවේදී ගරු සභාපතිතුමා විසින් මේ කරුණ සම්බන්ධව මුදල්කමිටුවට යොමුකර තව දුරටත් අවශ්‍ය තොරතුරු ගෙන ඉදිරි කටයුතු සිදුකරන ලෙසත් කාරක සභාව මහා සභාවක් බවට පත්වන ලෙසත් දැනුම් දුණි.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදිප් මහතාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහා සභාව බවට පත් විය.** ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

කිරිඇල්ල නව වෙළඳ සංකීර්ණයේ පිහිටි අංක 04,අංක 05,අංක 06, හා අංක 07 දරණ කඩ කාමර ටෙන්ඩර් කිරීම සම්බන්ධව මෙම සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට යොමුකර වැඩිදුරටත් තොරතුරු ගෙන ඉදිරි කටයුතු කිරීමට කටයුතු කරමු.

ඒ අනුව කිරිඇල්ල නව වෙළඳ සංකීර්ණයේ පිහිටි අංක 04,අංක 05,අංක 06, හා අංක 07 දරණ කඩ කාමර ටෙන්ඩර් කිරීම සම්බන්ධව මෙම සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට යොමුකර වැඩිදුරටත් තොරතුරු ගෙන ඉදිරි කටයුතු කිරීමට සභාව එකඟවිය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා

06-11. ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමය මගින් පවත්වනු ලබන ප්‍රශස්ථ වාර්ෂික කාර්යසාධන වාර්තා හා ගිණුම් සම්මාන තරඟාවලියට කුරුවිට සභාව ද ඉදිරිපත් වීමට හා ඒ සඳහා ඇතුලත්වීමේ ගාස්තුව වන රු.20 000.00 ක මුදල ගෙවීම් කිරීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසු ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමය මගින් පවත්වනු ලබන ප්‍රශස්ථ වාර්ෂික කාර්යසාධන වාර්තා හා ගිණුම් සම්මාන තරඟාවලියට කුරුවිට සභාව ද ඉදිරිපත් වීමට හා ඒ සඳහා ඇතුලත්වීමේ ගාස්තුව වන රු.20 000.00 ක මුදල ගෙවීම් කිරීමට මහාසභා වේ ඒකමතිකව තීරණය විය.

**07. කාරක සභාවල වාර්තා ඉදිරිපත් කිරීම - නැත.**

**08 . ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ,එකතු කල ආදායම් පිලිබඳ ප්‍රගති වාර්තා** - නැත.

**09.** සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම් - **රීති 33 පරිදි දිනට නියමිත කටයුතු අනුපිලිවෙල වෙනස් කොට සාකච්ජා කොට ඇත.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා

**අද දින මහා සභාවේ සියළු කටයුතු සඳහා සහාය දුන් සියළු ගරු මන්ත්‍රීතුමන්ලාට ,මාධ්‍ය හිතවතුන්ට,කාර්යමණ්ඩලයට ස්තුතියි.**
සභාවේ කටයුතු ප.ව. 2.54 ට ට පමණ අවසන් කරන ලදී.

එම්.විකසිතපුෂ්පසූරිය,

සභාපති,

ප්‍රාදේශීය සභාව,

කුරුවිට.

පිටපත් : -
01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී